# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල
# மாவட்ட செயலகம் - பதுளை
# District Secretariat - Badulla



# 2023
## වාර්ෂික කාර්යසාධන වාර්තාව
## வருடாந்த செயலாற்றுகை அறிக்கை
## Annual Performance Report

# 2023


## වාර්ෂික කාර්යසාධන වාර්තාව

## බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**වැය ශීර්ෂ අංකය -276**

# බදුල්ල දිස්ත්‍රික් ලේකම්තුමන්ගේ පණිවිඩය

**පාරිසරික, සමාජයීය හා ආර්ථික යන ත්‍රිත්ව මානයන් සුසංයෝජනය හා ඒකාබද්ධ ප්‍රවේශය තුළින් දිගුකාලීන, තිරසර සමෘද්ධිමත් සමාජයක් ගොඩනැගෙනු ඇත.........................**



ඉහළ ආර්ථික වර්ධනයක් නිරන්තරයෙන් පවත්වා ගැනීමට උදෙසා සහ ආර්ථික වශයෙන් සංවර්ධනය ලඟා කර ගැනීම සඳහා කාර්යක්ෂම ආර්ථික හා සමාජ යටිතල පහසුකම් පද්ධතියක් සහ ශක්තිමත් නියාමන රාමුවක් පැවතීම පූර්ව අවශ්‍යතාවයක් වනු ඇත.ශ්‍රී ලංකාවේ ආර්ථිකය මෙතෙක් වාර්තා වු අසීරුතම කාලපරිච්ඡේදයක් වු පෙර වර්ෂය තුළ රජය විසින් ලබා දුන් ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග ක්‍රියාවට නැංවීම උදෙසා දිස්ත්‍රික්කයක් ලෙසින් මනා වු සම්බන්ධිකරණයක් බදුල්ල දිස්ත්‍රික්කය තුළ නිර්මාණය වි තිබිණි. සංවර්ධනය වෙමින් පවතින ආර්ථික තත්ත්වයකින් හෙබි සහ කෘෂිකර්මය ජීවනෝපාය කර ගත් ජනතාවක් ජීවත් වන්නා වු දිස්ත්‍රික්කයක් ලෙස ප්‍රජාවගේ සාමාජීය හා ආර්ථික තත්ත්වයන්ගේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් බදුල්ල දිස්ත්‍රික්කය තුළ සිදුවිය යුතුව ඇත.

ඒ අනුව 2023 වර්ෂය ආර්ථික දුෂ්කරතා අභිමුවෙහි වුවද රාජ්‍ය මැදිහත් වීම තුලින් විවිධාකාරයේ ආර්ථික අවස්ථාවන් උදා කර ගනිමින් ස්වයංපෝෂිත සංවර්ධිත රටක් නිර්මාණය කිරීම උදෙසා පැවති බාධක මැඩලමින් අභියෝග ජයගනිමින් රාජ්‍ය සේවයේ උපරිම දායකත්වය දක්වු වර්ෂයක් ලෙස දැක්විය හැකි වනු ඇත.

දිස්ත්‍රික්කයක් ලෙසින් ගත් කල බදුල්ල දිස්ත්‍රික්කයට රට තුල පැවති ආර්ථික අභියෝග හමුවේ වුවද 2023 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 තුළ සෞභාග්‍යා ගම්මාන වැඩසටහන, ආහාර සුරක්ෂිතතා වැඩසටහන , ලෝක ආහාර වැඩසටහන හා සමෘද්ධි නිවාස සංවර්ධන වැඩසටහන යටතේ අඩුආදායම්ලාභීන් උදෙසා සහන සැලසීමත් හා සංවර්ධන කටයුතු උදෙසා සක්‍රීය දායකත්වයක් සැපයීමට හැකියාව ලැබිණි.

ඒමෙන්ම සියලුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය කරමින් බදුල්ල දිස්ත්‍රික්කයේ ආපදා අවදානම් අවම කිරීමේ ශ්‍රමදාන ක්‍රියාත්මක කිරීම යන සංකල්පය මත ග්‍රාමීය ප්‍රජාව , රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන ආයතනයන සම්බන්ධීකරණය වෙමින් ප්‍රජා දායකත්වය මත ව්‍යාපෘති දියත් කිරීමත්, දිස්ත්‍රික්කයේ ජනතාවගේ සුබසිද්ධිය උදෙසා මුදල් වැය නොකරමින් ප්‍රජාවගේ දායකත්වය ද ලබා ගනිමින් ග්‍රාමීය මට්ටමේ ව්‍යාපෘති රාශියක් සිද්දු කිරීමට අවකාශ ලැබිණි.

පැවති අභියෝග හමුවේ වුවද ජාතික සංවර්ධනයට හා නිෂ්පාදනයට සැලකිය යුතු මට්ටමකට දායකත්වයක් දැක්වීමට හැකියාව ලැබීම දිස්ත්‍රික්කයක් ලෙස අප ලද ජයග්‍රහණයක් ලෙස සලකන අතර පවත්නා භෞතික හා මානව සම්පත් නිසියාකාරව කලමනාකරණය කරගනිමින් කෘෂිකාර්මික හා කාර්මික අංශයේ නව්‍යකරණය තුලින් නවීන දැනුම සමාජ ගත කර 2023 වර්ෂයේ ඒකාබද්ධ ප්‍රවේශයක් තුළ සිදුකළා වු කාර්යභාර්ය එකී ජයග්‍රහණ උදෙසා ශක්තියක් විය.

2023 වර්ෂයේ මූල්‍ය තොරතුරු සහ කාර්ය සාධන විස්තරයන් ඇතුලත් කරමින් මුදල් රෙගුලාසි 402 ප්‍රකාරව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට වෙත ඉදිරිපත් කිරීම උදෙසා සැකසූ **"කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම් 2023 වාර්තාව"** තුල දිස්ත්‍රික්කයක් ලෙස අපගේ ප්‍රගතිය, අප සතු වු විභවතාවයන්, මුහුණ දුන් අභියෝග හා ඉදිරි ඉලක්ක පිලිබඳ සවිතරාත්මක කරුණු අනතර්ගත වන්නේය.

පණ්ඩුක ශ්‍රී ප්‍රභාත් අබේවර්ධන
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
බදුල්ල

# 2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල

# වැය ශීර්ෂ අංකය - 276

## අන්තර්ගතය


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

| විස්තරය | | පිටු අංක |
|---|---|---|

**පරිච්ඡේදය 01**
**ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය**


| | | |
|---|---|---|
| 1.1 | හැඳින්වීම | 02 |
| 1.2 | ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු | 15 |
| 1.3 | ප්‍රධාන කාර්යයන් | 16 |
| 1.4 | සංවිධාන සටහන | 18 |
| 1.5 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 19 |
| 1.6 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආයතනගත අරමුදල් | 19 |


**පරිච්ඡේදය 02**
**ප්‍රගතිය හා ඉදිරි දැක්ම**


| | | |
|---|---|---|
| 2.1 | ප්‍රගතිය | 21 |
| 2.2 | ජයග්‍රහන | 25 |
| 2.3 | අභියෝග | 26 |
| 2.4 | ඉදිරි ඉලක්ක | 26 |


**පරිච්ඡේදය 03**
**වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය**


| | | |
|---|---|---|
| 3.1 | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය | 28 |
| 3.2 | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 29 |
| 3.3 | මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 30 |
| 3.4 | මූල්‍ය ප්‍රකාශ සටහන් | 31 |
| 3.5 | ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය | 53 |
| 3.6 | වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය | 55 |
| 3.7 | මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙක් ලෙස බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන | 56 |
| 3.8 | මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය | 58 |
| 3.9 | විගණකාධිපතිවරයාගේ වාර්තාව | 59 |


**පරිච්ඡේදය 04**
**කාර්ය සාධන දර්ශක**


| | | |
|---|---|---|
| 4.1 | ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) | 80 |

**විස්තරය** **පිටු අංක**

**පරිච්ඡේදය 05**

**තිරසර සංවර්ධන අරමුණු(SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**


| | | |
|---|---|---|
| 5.1 | හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු | 82 |
| 5.2 | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග | 83 |


**පරිච්ඡේදය 06**
**මානව සම්පත් පැතිකඩ**


| | | |
|---|---|---|
| 6.1 | සේවක සංඛ්‍යා කළමනාකරණය | 85 |
| 6.2 | ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න | 85 |
| 6.3 | මානව සම්පත් සංවර්ධනය | 86 |


**පරිච්ඡේදය 07**
**අනුකූලතා වාර්තාව**


| | | |
|---|---|---|
| 7.1 | අනුකූලතා වාර්තාව | 89 |

# 01 පරිච්ඡේදය

## ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3 ප්‍රධාන කාර්යයන්

1.4 සංවිධාන සටහන

1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

1.6 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආයතනගත අරමුදල්

## 1.1 හැඳින්වීම

## බදුල්ල දිස්ත්‍රික්කයේ ඉතිහාසයෙන් බිඳක්

ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා දිවෙන ඉතිහාසයකට උරුමකම් කියන බදුල්ල දිස්ත්‍රික්කයේ ඉතිහාසය පිරික්සීමේ දී ගම්‍යමාන වන්නේ විජයාවතරණයටත් පෙර රාජ්‍ය ව්‍යුහයක් සහිත දියුණු ජන කොටසක් ජීවත් වූ ප්‍රදේශයක් ලෙසය. රාවණා ඇල්ල ප්‍රදේශය මීට වසර 6000 කට පෙර එනම්, ක්‍රි.පූ. 1800-1900 පෙර සිය නිජභූමිය කොට ගෙන රාජ්‍ය පාලනය කළේ යැයි ජනප්‍රවාදයේ එන රාවණා රජු පිළිබඳ ඉතිහාසය පුරාවෘත්තය විමසීමේ දී සනාථ වන ප්‍රබල සාධකයන් රැසක් ඉන්දීය සාහිත්‍ය ඉතිහාසයෙන් හමුවේ. වාල්මිකී විසින් රචිත රාමායනය රාවණා රජු හා සබැඳිව ලියන ලද කෘතියක්ය. එමෙන්ම රාවණා වීණාව නමින් සංගීත භාණ්ඩයක්ද තිබී ඇත. මධ්‍ය ශිලා යුගයේ සිටම ඌවේ මිනිස් ජනාවාස තිබූ බව පී.ඊ.පී.දැරණියගල මහතාගේ පරීක්ෂණවලින් සොයාගෙන ඇත. රාවණා ඇල්ල ගල්ගෙයි කරන ලද කැණීම්වලින් මිනිස් ඇටකටු හා ශිලා මෙවලම් ද කාදමන ලද සතුන්ගේ අවශේෂයන් ද හමු වී ඇත.

ප්‍රාග් ඉතිහාසයේ තවත් ඈතට යන මධ්‍ය ශිලා යුගයක් පිළිබද සාක්ෂි බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල අවට කදු මුදුන් රැසකින් ලැබී ඇත. මධ්‍ය ශිලා යුගය දැක්වෙන මයික්‍රොලිත ශිලා පතුරු බණ්ඩාරවෙල සිට වැලිමඩ මාර්ගයේ පිහිටා ඇති ඇන්ග්ලින් දේවස්ථානය පිහිටි චර්ච් හිල් නම් ස්ථානයෙන් හමු වී ඇත. බුදුපියාණන් වහන්සේ ක්‍රි.පු.06 වන සියවසේ බුද්ධත්වයෙන් 09 වන මස දුරුතු පුර පසළොස්වක පොහෝදින මහවැලි ගංගා නිම්නයේ සිය ජනාවාස පිහිටුවා ගෙන සිටි යක්ෂ ගෝත්‍රිකයන් ජීවත් වූ වත්මන් මියුගුණ සෑරදුන් (මහියංගණ සෑය) පිහිටි ස්ථානයට වැඩි සේක. මෙය බුදුරදුන්ගේ ප්‍රථම ලංකා ගමනය වීමත් සුවිශේෂී සිදු වීමකි. බුදුපියාණන් වහන්සේගෙන් බණ ඇසූ සුමන නම් ජනප්‍රධානියා බුදුපියාණන් වහන්සේගෙන් පුද සත්කාර කිරීම සඳහා යම් පාරිභෝගික වස්තුවක් ඉල්ලා සිටි අවස්ථාවේ කේෂධාතු මිටක් බුදුරඳුන් විසින් පිරිනමා ඇත. එම ධාතුන් වහන්සේලා තැන්පත් කොට සුමන සමන් ජනප්‍රධානියා විසින් ඉදිකළ සෑය යුග කිහිපයකදී ප්‍රතිසංස්කරණය වී ඇත. එය වත්මන් මියුගුණ සෑරදුන් බව, ඉතිහාසයේ සඳහන් වේ. චෛත්‍යයක් නිර්මාණය කිරීමට තරම් කලා කුසලතාවයක් මෙන්ම දියුණු සමාජ ක්‍රමයක් තිබීමෙන් ගම්‍යමාන වන්නේ බුදුන් දවස පවා මෙම ප්‍රදේශ දියුණු තත්ත්වයක පැවති ප්‍රදේශ ලෙසය. සුමනසමන් නමින් සිටි ජන ප්‍රධානියා පසුව සුමන සමන් දෙවියන් ලෙසින් පිදුම් ලැබූ බව සඳහන් වේ. බුදු දහම වැනි ගැඹුරු දහමක් අවබෝධ කර ගැනීමට තරම් ඔවුන් එදා ඥාණවන්ත පිරිසක් ලෙසින් දියුණු සංස්කෘතියක් සහිත ජන කොටසක්ව ඉන්නට ඇතැයි සිතිය හැකිය.

බදුල්ල දිස්ත්‍රික්කයේ තවත් සුවිශේෂී ස්ථානයක් වන්නේ ඓතිහාසික බදුල්ල මුතියංගණ රජමහා විහාරස්ථානය පිහිටි පුණ්‍ය භූමියයි. බුදුපියාණන් වහන්සේගේ තෙවනවර ලංකා ගමනයේ දී කැලණියට වැඩි අවස්ථාවේ දී මොහොතක් සමාධි සුවයෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ ඓතිහාසික බදුල්ල මුතියංගණ රජමහා විහාරස්ථානය පිහිටි මෙම ස්ථානයේ වැඩ සිට ඇත. මෙම ස්ථානයේ දී ඉන්දික නම් ජනප්‍රධානියෙක් දහම් අසා පැහැදී වන්දනා මාන කිරීමට යමක් ඉල්ලූවිට බුදුරජාණන් වහන්සේ ඩා බිදු කිහිපයක් දුන් බවත්, මොහොතකින් ඒවා මුතු බවට පත් වූ බවත්, එම මුතු තැන්පත් කොට ඉදිකළ චෛත්‍යය මුතියංගණය ලෙසින් ප්‍රසිද්ධ වී ඇත. නමුණුකුලට අධිපති දෙවියන් ලෙසින් මෙතුමන් පසු කාලීනව ප්‍රසිද්ධව ඇත.


# බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටීම

ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයෙහි නැගෙනහිර කොටසෙහි පිහිටි බදුල්ල දිස්ත්‍රික්කය වෙනමම “භූගෝලීය ප්‍රදේශයක් ” ලෙස හැඳින්විය හැකිය. උතුරු හා දකුණු දිසාගත කඳු වැටි සහ ඒවාට අතරමැදි නිම්න, භූ දර්ශනය සම මුඳුන් උන්නතාංශය මධ්‍ය කඳුකරයේ පැහැදිළි වියළි ප්‍රදේශයක් වීම, දිවයිනේ කැටි වළාකුළු ඇති වන ප්‍රභව ප්‍රදේශයක් වීම, කඳු බාධක සහ විශාල නිම්නයකින් වටවී තිබීම වැනි භූගෝලීය ලක්ෂණ ප්‍රදේශයට ඒකීයත්වය ලබා දෙයි. උතුරින් දුම්බර යටි නැම්මෙන්ද, නැගෙනහිරින් හා දකුණින් උස් කඳු වේදිකාවලින් ද, බටහිරින් මධ්‍ය කඳු නාරටිය නැගෙනහිර මායිමෙන්ද වටවුණු මෙම ප්‍රදේශය සැබවින්ම “ද්‍රෝණියකි”. මෙම බදුලු ද්‍රෝණිය මධ්‍ය කඳු නාරටියෙන් සෑහෙන පමණ මොහොර බෑවුමකින් මායිම් වී ඇති මුත් වයඹ මායිමෙන් පිහිටි රාගල වේදිකාවේ සිට පියගැට පෙළකින් බසින අයුරින් ද්‍රෝණියට පිවිසිය හැකිය. ද්‍රෝණියේ සාමාන්‍ය උන්නතාංශය මීටර් 1400 ක් තරම්ය. වැලිමඩ සානුව, බදුලු ද්‍රෝණිය, නමුණුකුල හා මඩොල්සිම වැටි නැගෙනහිරින් සහ දකුණු වේදිකා ප්‍රදේශයේ පැහැදිළි භෞතික ලක්ෂණ විද්‍යාමාන කරවයි. හපුතලේ වැටිය ද්‍රෝණියේ නිරිතදිග මායිමේ පිහිටියේය.


විද්‍යානුකූලව බදුලු දිස්ත්‍රික්කයේ පවතින්නේ දැඩි සංකීර්ණත්වයකි. මෙම සංකීර්ණ පටු නිම්න ඔස්සේ ගලන ගංගා ප්‍රතිරෝධක පාෂාණ පිහිටි ප්‍රදේශ හෝ විභේද නිසා ඇති වූ මොහොරවලින් ගැලීමේදී දියඇළි ඇති කරයි. උමා ඔයේ බටහිර ශාඛාවේ කුරුඳු ඔය ඇල්ල, බදුලු ඔයේ දුන්හිඳ ඇල්ල, කිරිඳි ඔය ආරම්භක ප්‍රදේශයේ දියලුම ඇල්ල සහ රාවණා ඇල්ල ද මෙසේ ඇති වූ දිය ඇළිවලට උදාහරණයි. කෙසේ වෙතත් සමස්තයක් වශයෙන් ගත්කල බදුලු ද්‍රෝණිය තුළ ඇත්තේ ජාලාකාර ජලවහන රටාවකි.


නැගෙනහිරින් හා දකුණින් මොණරාගල දිස්ත්‍රික්කය සහ රත්නපුර දිස්ත්‍රික්ක ද උතුරින් අම්පාර හා මහනුවර දිස්ත්‍රික්ක ද බස්නාහිරින් නුවරඑළිය සහ රත්නපුර දිස්ත්‍රික්ක ද මායිම් වන බදුල්ල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාද්වීපයේ පිහිටි වර්ග කිලෝමීටර් 2861 ක මනෝරම්‍ය භූමි භාගයකි.

# දිස්ත්‍රික්කයේ සිතියම




# පරිපාලන ව්‍යුහය





## බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පාලනය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 කි. එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 තුල ග්‍රාම නිලධාරි කොට්ඨාස 567 පවතී. එම ග්‍රාම නිලධාරි කොට්ඨාස 567 හි ගම් 2,817 ක් ද, වතු 186 ක් ද, පිහිටා ඇත. පළාත් පාලන ආසන මට්ටමෙන් ගත් විට ප්‍රාදේශීය සභා 15 ක්, නගර සභා 01 ක් හා මහ නගර සභා 02 ක් පවතී.



## ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිහිටීම

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | පිහිටීම | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිට දුර (කි.මී.) |
|---|---|---|
| මහියංගණය | මහියංගණ-හසලක මාර්ගයේ ගම් උදා භූමිය තුළ | 65.0 |
| රිදීමාලියද්ද | ආදාඋල්පත බිබිල මාර්ගයේ 7 කි.මී. දුරින් | 53.0 |
| මීගහකිවුල | බදුල්ල මහියංගණ මාර්ගයේ මීගහකිවුල නගරය අසල | 23.0 |
| කන්දකැටිය | 21 හංදිය- ගලඋඩ මාර්ගයේ 5 කි.මී. දුරින් | 39.0 |
| සොරණාතොට | බදුල්ල - මහියංගණ මාර්ගයේ රිදීපාන | 2.0 |
| බදුල්ල | බදුල්ල කච්චේරි සංකීර්ණය තුළ | 0.0 |
| පස්සර | පස්සර නගරය අසල | 20.0 |
| හාලිඇල | බදුල්ල - හාලිඇල මාර්ගයේ 5 කි.මී. දුරින් | 7.0 |
| වැලිමඩ | වැලිමඩ නගරයේ බස් නැවතුම්පල අසල | 32.0 |
| ඌවපරණගම | ඌවපරණගම - ලූණුවත්ත උප නගරයේ | 45.0 |
| බණ්ඩාරවෙල | බණ්ඩාරවෙල නගර සභා මාර්ගයේ මහ නගර සභාව ඉදිරිපිට | 28.0 |
| ඇල්ල | කුඹල්වෙල - වැල්ලවාය මාර්ගයේ ඇල්ල නගරය තුළ | 23.0 |
| හපුතලේ | දියතලාව නගර මධ්‍යයේ | 36.0 |
| හල්දුම්මුල්ල | බෙරගල - බලංගොඩ මාර්ගයේ හාල්අටුතැන්න | 52.0 |
| ලුණුගල | පස්සර - බිබිල මාර්ගයේ ලුණුගල නගරය අසල | 40.0 |

## ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල වසම් සංඛ්‍යාව/භූමි ප්‍රමාණය/ගම්මාන සංඛ්‍යාව


| අනු අංකය | ප්‍රා.ලේ.කොට්ඨාසය | වසම් සංඛ්‍යාව | කොට්ඨාසයේ භූමි ප්‍රමාණය (Km 2) | ගම්මාන සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | මහියංගනය | 35 | 601 | 201 |
| 2 | රිදීමාලියද්ද | 42 | 431 | 170 |
| 3 | මීගහකිවුල | 20 | 105 | 101 |
| 4 | කන්දකැටිය | 26 | 157 | 104 |
| 5 | සොරණාතොට | 25 | 79 | 134 |
| 6 | බදුල්ල | 29 | 51 | 201 |
| 7 | හාලිඇල | 57 | 165 | 317 |
| 8 | ඇල්ල | 32 | 111 | 205 |
| 9 | බණ්ඩාරවෙල | 35 | 71 | 156 |
| 10 | හපුතලේ | 26 | 72 | 120 |
| 11 | හල්දුම්මුල්ල | 39 | 412 | 227 |
| 12 | වැලිමඩ | 64 | 188 | 295 |
| 13 | ඌවපරණගම | 68 | 138 | 401 |
| 14 | පස්සර | 41 | 136 | 179 |
| 15 | ලුණුගල | 28 | 144 | 113 |
| එකතුව | | **567** | **2,861** | **2,924** |

මූලාශ්‍රය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ - 2022

# ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අංශ අනුව ජනගහනය

| අනු අංකය | ප්‍රා.ලේ. කොට්ඨාසය | ජනගහනය | | |
|---|---|---|---|---|
| | | නාගරික | ග්‍රාමීය | වතු |
| 1 | මහියංගනය | 3,990 | 90,058 | 0 |
| 2 | රිදීමාලියද්ද | 0 | 64,800 | 94 |
| 3 | මීගහකිවුල | 0 | 23,116 | 2,543 |
| 4 | කන්දකැටිය | 1,119 | 26,487 | 1,092 |
| 5 | සොරණාතොට | 567 | 21,783 | 4,752 |
| 6 | බදුල්ල | 47,096 | 28,313 | 11,281 |
| 7 | හාලිඇල | 1,385 | 70,982 | 33,001 |
| 8 | ඇල්ල | 594 | 37,721 | 15,292 |
| 9 | බණ්ඩාරවෙල | 25,549 | 37,707 | 10,687 |
| 10 | හපුතලේ | 5,267 | 31,577 | 21,672 |
| 11 | හල්දුම්මුල්ල | 1,411 | 25,695 | 19,088 |
| 12 | වැලිමඩ | 0 | 105,245 | 12,902 |
| 13 | ඌවපරණගම | 567 | 79,665 | 13,318 |
| 14 | පස්සර | 1,972 | 32,160 | 22,654 |
| 15 | ලුණුගල | 0 | 17,962 | 23,216 |
| | **එකතුව** | **89,517** | **693,271** | **191,592** |


මූලාශ්‍රය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ - 2022



# ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්
# ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනගහනය

| අනු අංක | ප්‍රා.ලේ.කොට්ඨාසය | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
|---|---|---|---|---|
| 1 | මහියංගනය | 46,327 | 47,721 | 94,048 |
| 2 | රිදීමාලියද්ද | 32,136 | 32,758 | 64,894 |
| 3 | මීගහකිවුල | 12,549 | 13,110 | 25,659 |
| 4 | කන්දකැටිය | 14,206 | 14,492 | 28,698 |
| 5 | සොරණාතොට | 13,339 | 13,763 | 27,102 |
| 6 | බදුල්ල | 45,431 | 41,259 | 86,690 |
| 7 | හාලිඇල | 54,816 | 50,552 | 105,368 |
| 8 | ඇල්ල | 26,383 | 27,224 | 53,607 |
| 9 | බණ්ඩාරවෙල | 35,930 | 38,013 | 73,943 |
| 10 | හපුතලේ | 28,483 | 30,033 | 58,516 |
| 11 | හල්දුම්මුල්ල | 22,361 | 23,833 | 46,194 |
| 12 | වැලිමඩ | 60,375 | 57,772 | 118,147 |
| 13 | ඌව පරණගම | 46,139 | 47,411 | 93,550 |
| 14 | පස්සර | 27,991 | 28,795 | 56,786 |
| 15 | ලුණුගල | 20,261 | 20,917 | 41,178 |
| එකතුව | | **486,727** | **487,653** | **974,380** |

මූලාශ්‍රය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ - 2022



## ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්
## වයස් කාණ්ඩ අනුව ජනගහනය

| අනු අංකය | ප්‍රා.ලේ. කොට්ඨාසය | වයස්කාණ්ඩ ( අවුරුදු ) | | | | | | | | | මුළු ජනගහනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 0-5 | 06-10 | 11-13 | 14-17 | 18-25 | 26-35 | 36-55 | 56-60 | 61 ට වැඩි | |
| 1 | මහියංගනය | 6,771 | 8,628 | 6,815 | 8,383 | 11,498 | 13,419 | 21,732 | 7,391 | 9,411 | 94,048 |
| 2 | රිදීමාලියද්ද | 4,834 | 5,528 | 3,855 | 4,940 | 7,022 | 10,061 | 16,934 | 4,859 | 6,861 | 64,894 |
| 3 | මීගහකිවුල | 1,886 | 2,087 | 1,451 | 1,752 | 3,401 | 3,955 | 5,944 | 2,061 | 3,122 | 25,659 |
| 4 | කන්දකැටිය | 2,073 | 2,328 | 1,684 | 1,865 | 2,998 | 5,066 | 7,268 | 1,914 | 3,502 | 28,698 |
| 5 | සොරණාතොට | 1,691 | 2,312 | 1,763 | 2,143 | 3,029 | 3,836 | 6,289 | 2,270 | 3,769 | 27,102 |
| 6 | බදුල්ල | 5,421 | 5,813 | 4,275 | 6,132 | 9,834 | 13,275 | 21,708 | 7,713 | 12,519 | 86,690 |
| 7 | හාලිඇල | 6,865 | 7,089 | 4,253 | 8,809 | 13,514 | 15,786 | 25,633 | 6,408 | 17,011 | 105,368 |
| 8 | ඇල්ල | 3,335 | 4,475 | 3,160 | 4,441 | 5,112 | 7,909 | 13,833 | 3,653 | 7,689 | 53,607 |
| 9 | බණ්ඩාරවෙල | 4,336 | 5,251 | 4,134 | 4,815 | 9,334 | 10,738 | 15,941 | 8,163 | 11,231 | 73,943 |
| 10 | හපුතලේ | 4,011 | 4,510 | 4,393 | 5,120 | 6,445 | 8,235 | 12,430 | 4,919 | 8,453 | 58,516 |
| 11 | හල්දුම්මුල්ල | 2,575 | 3,764 | 2,929 | 3,449 | 5,201 | 6,546 | 10,686 | 4,209 | 6,835 | 46,194 |
| 12 | වැලිමඩ | 7,665 | 8,275 | 6,855 | 8,150 | 12,840 | 16,873 | 30,791 | 11,505 | 15,193 | 118,147 |
| 13 | ඌව පරණගම | 5,773 | 6,857 | 5,350 | 6,932 | 10,809 | 13,442 | 22,535 | 8,083 | 13,769 | 93,550 |
| 14 | පස්සර | 3,078 | 4,116 | 3,326 | 4,177 | 6,931 | 8,449 | 12,950 | 4,947 | 8,812 | 56,786 |
| 15 | ලුණුගල | 2,734 | 3,504 | 2,507 | 3,264 | 4,603 | 6,814 | 8,697 | 3,172 | 5,883 | 41,178 |
| එකතුව | | **63,048** | **74,537** | **56,750** | **74,372** | **112,571** | **144,404** | **233,371** | **81,267** | **134,060** | **974,380** |


මූලාශ්‍රය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ - 2022

## ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව

### උපත්, මරණ, විවාහ සංඛ්‍යාව

| අංකය | ප්‍රා.ලේ. කොට්ඨාසය | උපත් | | මරණ | | | විවාහ | |
|---|---|---|---|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | ළදරු මරණ | පිරිමි | ගැහැණු | සාමාන්‍ය | මුස්ලිම් |
| 1 | මහියංගනය | 705 | 726 | 22 | 177 | 99 | 356 | 14 |
| 2 | රිදීමාලියද්ද | 377 | 421 | 3 | 150 | 135 | 398 | - |
| 3 | මීගහකිවුල | 119 | 140 | 3 | 78 | 77 | 147 | - |
| 4 | කන්දකැටිය | 135 | 154 | 2 | 92 | 70 | 92 | - |
| 5 | සොරණාතොට | 105 | 116 | 5 | 98 | 73 | 133 | 46 |
| 6 | බදුල්ල | 400 | 460 | 2 | 194 | 165 | 233 | 28 |
| 7 | හාලිඇල | 440 | 508 | 6 | 404 | 328 | 484 | 99 |
| 8 | ඇල්ල | 247 | 251 | 4 | 223 | 178 | 192 | 27 |
| 9 | බණ්ඩාරවෙල | 359 | 294 | 1 | 194 | 187 | 257 | 45 |
| 10 | හපුතලේ | 303 | 349 | 1 | 111 | 92 | 201 | 59 |
| 11 | හල්දුම්මුල්ල | 250 | 291 | 8 | 117 | 109 | 192 | 3 |
| 12 | වැලිමඩ | 591 | 597 | 4 | 380 | 290 | 431 | 189 |
| 13 | ඌවපරණගම | 375 | 394 | 3 | 291 | 295 | 395 | 27 |
| 14 | පස්සර | 232 | 268 | 1 | 161 | 121 | 234 | 37 |
| 15 | ලුණුගල | 177 | 178 | 2 | 125 | 91 | 127 | 10 |
| | එකතුව | **4,815** | **5,147** | **67** | **2,795** | **2,310** | **3,872** | **584** |


මූලාශ්‍රය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ - 2022



## ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව
## සේවා නියුක්ති ජනගහනය හා සේවා වියුක්ති ජනගහනය

| අනු අංකය | ප්‍රා.ලේ.කොට්ඨාසය | සේවා වියුක්ති ජනගහනය | සේවා නියුක්ති ජනගහනය |
|---|---|---|---|
| 1 | මහියංගනය | 16,517 | 46,620 |
| 2 | රිදීමාලියද්ද | 14,116 | 29,386 |
| 3 | මීගහකිවුල | 4,782 | 12,829 |
| 4 | කන්දකැටිය | 5,268 | 14,886 |
| 5 | සොරණාතොට | 7,101 | 10,438 |
| 6 | බදුල්ල | 10,752 | 42,545 |
| 7 | හාලිඇල | 19,607 | 51,990 |
| 8 | ඇල්ල | 10,845 | 25,204 |
| 9 | බණ්ඩාරවෙල | 6,505 | 28,724 |
| 10 | හපුතලේ | 10,134 | 25,297 |
| 11 | හල්දුම්මුල්ල | 10,423 | 18,589 |
| 12 | වැලිමඩ | 31,465 | 51,077 |
| 13 | ඌවපරණගම | 17,223 | 50,107 |
| 14 | පස්සර | 20,762 | 18,168 |
| 15 | ලුණුගල | 11,414 | 17,462 |
| | එකතුව | **196,914** | **443,322** |


මූලාශ්‍රය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ - 2022



## නිවාස ඒකකයේ ව්‍යූහය අනුව
## ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් පදිංචි නිවාස ගණන

| අංකය | ප්‍රා. ලේ. කොට්ඨාසය | තනි මහලේ නිවාස | මහල් දෙකේ තනි නිවාස | මහල් දෙකට වැඩි තනි නිවාස | අනුයුක්ත නිවාස /උපගෘහය (ANNEX) | මහල් නිවාස | පැල්පත් /නිවාස/ මුඩුක්කු නිවාස | පේලි නිවාස | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | මහියංගනය | 23,898 | 868 | 37 | 87 | 14 | 441 | 9 | 25,354 |
| 2 | රිදීමාලියද්ද | 17,160 | 255 | 10 | 36 | 2 | 180 | 8 | 17,651 |
| 3 | මීගහකිවුල | 5,947 | 201 | 2 | - | - | 57 | 723 | 6,930 |
| 4 | කන්දකැටිය | 7,139 | 256 | 3 | 4 | - | 261 | 115 | 7,778 |
| 5 | සොරණාතොට | 6,101 | 316 | 21 | 86 | 64 | 33 | 598 | 7,219 |
| 6 | බදුල්ල | 13,944 | 3,936 | 393 | 1,011 | 926 | 203 | 1,523 | 21,936 |
| 7 | හාලිඇල | 21,430 | 1,347 | 133 | 63 | | 68 | 4,886 | 27,927 |
| 8 | ඇල්ල | 10,794 | 850 | 173 | 34 | 31 | 23 | 1,925 | 13,830 |
| 9 | බණ්ඩාරවෙල | 15,291 | 1,862 | 210 | 365 | 29 | 104 | 1,957 | 19,818 |
| 10 | හපුතලේ | 8,682 | 1,416 | 120 | 200 | 228 | 105 | 2,965 | 13,716 |
| 11 | හල්දුම්මුල්ල | 9,303 | 385 | 33 | 46 | 4 | 316 | 2,411 | 12,498 |
| 12 | වැලිමඩ | 24,885 | 1,586 | 158 | 201 | 69 | 228 | 1,548 | 28,675 |
| 13 | ඌවපරණගම | 21,006 | 837 | 22 | 198 | - | 179 | 2,185 | 24,427 |
| 14 | පස්සර | 9,556 | 918 | 34 | 98 | 3 | 82 | 3,423 | 14,114 |
| 15 | ලුණුගල | 6,790 | 143 | 13 | 6 | - | 106 | 2,861 | 9,919 |
| | එකතුව | **201,926** | **15,176** | **1,362** | **2,435** | **1,370** | **2,386** | **27,137** | **251,792** |

මූලාශ්‍රය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ- 2022



## දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණ රටාව

| ඉඩමේ ස්වාභාවය | භූමි ප්‍රමාණය (හෙක්ටයාර ) | ප්‍රතිශතය |
|---|---|---|
| ගොඩනගන ලද ඉඩම් | 3,588 | 1.25 |
| ගෙවතු වගා | 69,785 | 24.39 |
| තේ | 29,668 | 10.37 |
| රබර් | 1,793 | 0.63 |
| පොල් | 65 | 0.02 |
| වී වගාව | 41,911 | 14.65 |
| වෙනත් බහු වාර්ෂික භෝග | 10,597 | 3.70 |
| ක්ෂේත්‍ර භෝග(සෘතුමය භෝග) | 14,135 | 4.94 |
| වෙනත් වගා (කුරුඳු,අඹ,ගම්මිරිස්,මල් වගාව, කෙසෙල්) | 679 | 0.24 |
| අතහැර දමන ලද කුඹුරු ඉඩම් | 132 | 0.05 |
| අතහැර දමන ලද තේ ඉඩම් | 102 | 0.04 |
| වනාන්තර | 50,079 | 17.50 |
| ලදු කැළෑ | 28,158 | 9.84 |
| තෘණභූමි | 8,182 | 2.86 |
| වනවගා | 9,627 | 3.36 |
| වගුරුබිම් | 42 | 0.01 |
| ජලාශ | 11,269 | 3.94 |
| පාෂාණ | 5,983 | 2.09 |
| හිස් ඉඩම් | 305 | 0.11 |
| **එකතුව** | **286,100** | **100.00** |

මූලාශ්‍රය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ- 2022

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

### දැක්ම

"පුරවැසි සංතෘප්තිය තුළින් තිරසාර සංවර්ධනයක් කරා ප්‍රාදේශීය පරිපාලනය මෙහෙයවීමේ නියමුවා"

### මෙහෙවර

"දිස්ත්‍රික්කය හා එහි ජනතාව ජාතික සංවර්ධනයට දායක වන පරිදි තිරසාර සංවර්ධනයක් උදෙසා රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව මනා සැලැස්මකින් යුතුව,
සම්පත් හා ආයතන ඵලදායි ලෙස මෙහෙයවන්නා වූ මනා සම්බන්ධීකරණයක් තුලින් ජනතා අවශ්‍යතා කාර්යක්ෂමව, සාධාරණව, යුක්තිගරුකව හා මිත්‍රශීලීව ඉටු කිරීම"

## 1.3 ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ වූ අනුබද්ධ ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් ඇතිව කටයුතු කිරීම.
- රජයේ සියලු අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය පවත්වාගෙන යමින් පැවරෙන කටයුතු ඉටු කිරීම.
- රජය හා පළාත් සභාව විසින් පවරා ඇති කටයුතු වෙනුවෙන් ආදායම් එකතු කිරීම.
- දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධීකරණය, අධීක්ෂණය හා පරිපාලනය සම්බන්ධ කටයුතු පවත්වාගෙන යාම.
- පළාත් සභාවට අදාළ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.
- මැතිවරණ පැවැත්වීමට අදාළ සියලු කටයුතු සිදු කිරීම.
- විමධ්‍යගත අයවැය වැඩ සටහන ඇතුළුව රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් පවරන ප්‍රතිපාදන යටතේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම.
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් ඇතුලු විවිධ විෂයන් සඳහා සම්බන්ධීකරණ රැස්විම් පැවැත්වීම හා ඊට අදාළ කටයුතු පවත්වාගෙන යාම.
- දිස්ත්‍රික්කයේ සියලු රාජ්‍ය, ආගමික, සංස්කෘතික ආදී උත්සව සංවිධානය කිරීම.
- සිවිල් සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් ජනතාව හා රාජ්‍ය ආයතන කටයුතු අතර සම්බන්ධීකරණය සඳහා දායක වීම හා පොදු සමාජයීය කාරණා නිරාකරණය සඳහා මැදිහත්ව කටයුතු කිරීම.


## අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අදාළව ඉටු කරන ප්‍රධාන කාර්යයන්

- ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- විශ්‍රාම වැටුප් ක්‍රියාත්මක කිරීම.
- සමෘද්ධි වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ආපදා කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ඉඩම් අත්පත් කිරීමේ කටයුතු
- උපත්,මරණ හා විවාහ ලියාපදිංචි කිරීමේ කටයුතු
- ඉඩම් සම්බන්ධ අනෙකුත් කටයුතු
- වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීම ඇතුළු ඊට සම්බන්ධ කටයුතු
- ආබාධිත පුද්ගලයින් සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- සමාජ සේවා කටයුතු
- ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ග්‍රාමීය හා ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සෞඛ්‍ය වැඩසටහන්
- ළමා හා කාන්තා සංවර්ධන වැඩසටහන්
- ජාතික ආරක්ෂක වැඩසටහන්
- කෘෂිකර්ම වැඩසටහන්
- පරිසර සංරක්ෂණ වැඩසටහන්

ඇතුළු වැඩසටහන් රාශියක් මෙම කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉටු කරන ලදී.මෙයට අමතරව පළාත් සභා ව්‍යාපෘති රාශියක් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල මැදිහත් වීමෙන් ක්‍රියාත්මක කරන ලදී.

- ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති
- විදුලි හා ජල ව්‍යාපෘති
- ගොඩනැගිලි ඉදිකිරීම්
- වෙනත් සමාජ සේවා ව්‍යාපෘති

## 1.4 සංවිධාන සටහන



## 1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස

| අනු අංකය | ප්‍රා.ලේ. කොට්ඨාසය | වසම් සංඛ්‍යාව | කොට්ඨාසයේ භූමි ප්‍රමාණය (Km $^{2}$) | ගම්මාන සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | මහියංගනය | 35 | 601 | 201 |
| 2 | රිදීමාලියද්ද | 42 | 431 | 170 |
| 3 | මීගහකිවුල | 20 | 105 | 101 |
| 4 | කන්දකැටිය | 26 | 157 | 104 |
| 5 | සොරණාතොට | 25 | 79 | 134 |
| 6 | බදුල්ල | 29 | 51 | 201 |
| 7 | හාලිඇල | 57 | 165 | 317 |
| 8 | ඇල්ල | 32 | 111 | 205 |
| 9 | බණ්ඩාරවෙල | 35 | 71 | 156 |
| 10 | හපුතලේ | 26 | 72 | 120 |
| 11 | හල්දුම්මුල්ල | 39 | 412 | 227 |
| 12 | වැලිමඩ | 64 | 188 | 295 |
| 13 | ඌවපරණගම | 68 | 138 | 401 |
| 14 | පස්සර | 41 | 136 | 179 |
| 15 | ලුණුගල | 28 | 144 | 113 |
| එකතුව | | **567** | **2,861** | **2,924** |

මූලාශ්‍රය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ- 2022

## 1.6 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආයතනගත අරමුදල්

| මූලයකරණය | | | | |
|---|---|---|---|---|
| **සංකේතය** | **සංකේත විස්තරය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **සත්‍ය වියදම** | **වියදමේ ප්‍රතිශතය** |
| **11** | දේශීය අරමුදල් | 1,598,207,000 | 1,491,622,097.72 | 93% |

# 02 පරිච්ඡේදය

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

**2.1 ප්‍රගතිය**


**2.2 ජයග්‍රහන**

**2.3 අභියෝග**

**2.4 ඉදිරි ඉලක්ක**

## 2.1 ප්‍රගතිය

| 2023 වර්ෂයේ කාර්ය සාධන තොරතුරු | | | |
|---|---|---|---|
| කාරණය | ඉලක්ක | සමුච්චිත ප්‍රගතිය | |
| | | සංඛ්‍යාත්මකව | ප්‍රතිශතයක් ලෙස |
| වාහන ආදායම් බලපත්‍ර ලබාදීම | 147,800 | 118,172 | 80% |
| රෙජිස්ට්‍රාර් අංශයේ සහතික නිකුත් කිරීම | 199,640 | 214,452 | 107% |
| ජාතික හැඳුනුම්පත් ලබාදීම | 22,950 | 23,132 | 101% |
| ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම | 1,330 | 1,398 | 105% |
| විදුලි පරීක්ෂණ පැවැත්වීම | 123 | 71 | 58% |



# 2023 වර්ෂයේ දිස්ත්‍රික්කයේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

## සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩිදියුණු කිරීමේ වැඩසටහන

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | අනුමත යෝජනා සංඛ්‍යාව | අනුමත මුදල | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (අනුමත මුදලේ ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|---|---|---|
| මහියංගනය | 1 | 9,020,000.00 | 1 | 9,020,000.00 | 100% |
| ඇල්ල | 1 | 143,500.00 | 1 | 143,500.00 | 100% |
| **එකතුව** | **2** | **9,163,500.00** | **2** | **9,163,500.00** | |

## උඩදියළුම ඇල්ල සංචාරක ආකර්ෂණීය ස්ථානය සංවර්ධනය කිරීම

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | අනුමත යෝජනා සංඛ්‍යාව | අනුමත මුදල | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (අනුමත මුදලේ ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|---|---|---|
| හල්දුම්මුල්ල | 1 | 2,800,000.00 | 1 | 2,613,164.30 | 100% |

## ලෝක ආහාර වැඩසටහන

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තෝරාගත් පවුල් සංඛ්‍යාව | ආහාර ද්‍රව්‍ය ප්‍රමාණය | | ලබාදුන් පවුල් සංඛ්‍යාව | ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | පරිප්පු **(20 kg)** බෑග් | තෙල් (කෑන්) | | |
| ඇල්ල | 3600 | 3600 | 3600 | 3600 | 100% |
| කන්දකැටිය | 3246 | 3246 | 3246 | 3246 | 100% |
| මීගහකිවුල | 1958 | 1958 | 1958 | 1958 | 100% |
| සොරණාතොට | 2605 | 2605 | 2605 | 2605 | 100% |
| හාලිඇල | 4161 | 4161 | 4161 | 4161 | 100% |
| පස්සර | 2047 | 2047 | 2047 | 2047 | 100% |
| ලුණුගල | 1881 | 1881 | 1881 | 1881 | 100% |
| ඌවපරණගම | 4655 | 4655 | 4655 | 4655 | 100% |

## අලුත් ගමක් අලුත් රටක් ජාතික ඒකාබද්ධතා සහභාගීත්ව සංවර්ධන වැඩසටහන

<table>
<tr><th>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය</th><th>ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්</th><th>සපයා ගත් මුදල</th><th>වැඩ අවසන් වැඩසටහන්</th><th>මූල්‍ය ප්‍රගතිය</th><th>අනුමත මුදලේ ප්‍රතිශතයක් ලෙස</th></tr>
<tr><td rowspan="18">බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15</td><td>1. පෝෂිත ගෙවතු ඇති කිරීම</td><td rowspan="18">13,506,211.00</td><td rowspan="18">හඳුනා ගන්නා ලද යෝජනා අවසන් කර ඇත.</td><td rowspan="18">13,506,211.00</td><td rowspan="18">100%</td></tr>
<tr><td>2. ප්‍රජා සහභාගීත්වයෙන් කුඹුරු යායවල්වල ඇළ වේලි සහ යටිතල පහසුකම් සංවර්ධනය</td></tr>
<tr><td>3. වසම් තුළ අළෙවි කාර්යයන්ට අදාළ වන ග්‍රාමීය කුඩා මාර්ග සංවර්ධනය</td></tr>
<tr><td>4. දැනුවත් කිරීමේ වැඩසටහන්</td></tr>
<tr><td>5. උපදේශන සේවා සැපයීම</td></tr>
<tr><td>6. අඩු ආදායම්ලාභී පවුල්වල ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා බාහිර ආයතනවල සහාය ලබා ගැනීම</td></tr>
<tr><td>7. සත්ත්ව නිෂ්පාදන ඉහළ නැංවීමේ වැඩසටහන්</td></tr>
<tr><td>8. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන ඉහළ නැංවීමේ වැඩසටහන්</td></tr>
<tr><td>9. ජංගම අළෙවි පොළ සංවිධානය</td></tr>
<tr><td>10. අතිරික්ත ආහාර නිෂ්පාදන හුවමාරුව සඳහා කටයුතු කිරීම</td></tr>
<tr><td>11. ඌන පෝෂිත පාසල් හා පෙර පාසල් ළමුන් සඳහා වැඩසටහන්</td></tr>
<tr><td>12. ඉඩම් බෙදාදීම</td></tr>
<tr><td>13. කෘෂිකාර්මික හා ස්වයං රැකියා පුහුණු වැඩසටහන්</td></tr>
<tr><td>14. පරිසර සංරක්ෂණ වැඩසටහන්</td></tr>
<tr><td>15. වගා නොකළ ඉඩම් වගා කිරීම</td></tr>
<tr><td>16. සනීපාරක්ෂක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම</td></tr>
<tr><td>17. අපනයන බෝග ප්‍රවර්ධන වැඩසටහන්</td></tr>
<tr><td>18. වෙනත් වැඩසටහන්</td></tr>
</table>

## 2023 වර්ෂයේ බදුල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කිහිපයක්

**ව්‍යාපෘතියේ නම - මිරිදිය ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**




| | |
|---|---|
| වැඩසටහන | - සෞභාග්‍යා නිශ්පාදන ගම්මාන වැඩිදියුණු කිරීමේ වැඩසටහන - 2023 |
| ව්‍යාපෘතිය | - මිරිදිය ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය |
| ප්‍රා.ලේ. කොට්ඨාසය | - මහියංගනය |
| ග්‍රා.නි. කොට්ඨාස | - රත්කිඳ, දිවුලපැලැස්ස, ගිරාඳුරුකෝට්ටේ |
| වෙන්කල මුදල රු.මි. | - 9. 02 |
| වියදම රු.මි. | - 9.02 |

## 2.2 ජයග්‍රහණ

- සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ දිස්ත්‍රික්කය තුල ව්‍යාපෘති 18 ක් අඛණ්ඩව ක්‍රියාවට නැංවීම.
- ආහාර සුරක්ෂිතතා වැඩසටහන යටතේ දිස්ත්‍රික්කය පුරා ව්‍යාපෘති 103ක් ක්‍රියාවට නැංවීම.
- ලෝක ආහාර වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභීන් 24153 ක් උදෙසා ප්‍රතිලාභ සැපයීම.
- සමෘද්ධි නිවාස වැඩසටහන යටතේ නව නිවාස 94 සෑදීමට කටයුතු කිරීම.
- සියලුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය කරමින් බදුල්ල දිස්ත්‍රික්කයේ ආපදා අවදානම් අවම කිරීමේ ශ්‍රමදාන ක්‍රියාත්මක කිරීම යන සංකල්පය මත ග්‍රාමීය ප්‍රජාව , රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන ආයතනයන සම්බන්ධීකරණය වෙමින් රු. 53,072,397.40ක වටිනාකමින් යුත් ව්‍යාපෘති 577 ප්‍රජා දායකත්වය මත දියත් කිරීම.
- බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 හි නියමිත කාලය තුල අවශ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා කර ගත් නිලධාරින් ප්‍රමාණය 100% දක්වා ඉහල නැංවීම.
- දිස්ත්‍රික්කය තුල වර්ග කිලෝමීටර් 325.51 ක් සඳහා දීමනා පත්‍ර හෝ බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කිරීම.
- ආපදාවන්ට ලක්වූවන් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ පවුල් 33ක් නීඩ්වුඩ් ප්‍රදේශයේ නැවත පදිංචි කිරීම.
- මහියංගන හා හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාල උදෙසා නව ගොඩනැගිලි ඉදිකිරීම.



*හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය*

## 2.3 අභියෝග

- රටතුල පවතින්නා වූ ආර්ථික අස්ථාවරත්වය
- ප්‍රදේශයේ ජනතාව තුල දැඩිව පවතින්නා වූ යැපුම් මානසිකත්වය
- දිස්ත්‍රික්කය වෙත බලපෑම් එල්ල කරන්නා වූ ස්වාභාවික ව්‍යසන තත්ත්වයන් පැවතීම.
- දිස්ත්‍රික්කය තුල පවතින පුහුණු ශ්‍රමිකයන්ගේ හිගකම
- වැඩි වශයෙන් දිස්ත්‍රික්කය තුලවූ ශ්‍රමික ප්‍රජාව විදෙස් ගත වීම
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුල පවතින ජොෂ්ට නිලධාරින්ගේ හා භෞතික සම්පත්වල හිඟ බව

## 2.4 ඉදිරි ඉලක්ක

- බදුල්ල දිස්ත්‍රික්කය තුල පවතිනා සංවර්ධන අවශ්‍යතාවයන් නිසි ලෙස හඳුනා ගනිමින් විධිමත් ආකාරයෙන් සංවර්ධන කටයුතු සිදු කිරීම.
- දිස්ත්‍රික්කය තුල පවතින සම්පත් උපරිම ලෙස උපයෝගිකර ගනිමින් ආර්ථික සාමාජීය හා යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාදාමය වේගවත් කිරීම.
- ශිල්පීය දැනුමෙන්, කුසලතාවයෙන් හා ආකල්පයන්ගෙන් හෙබි සමාජයක් නිර්මාණය කිරීම උදෙසා අවශ්‍ය මූලික ක්‍රියා මාර්ග ගැනීම සහ ඒ තුලින් දිස්ත්‍රික්කයේ ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම.
- දේශගුණික විපර්යාස, ස්වාභාවික ව්‍යසනයක් හා ඒවායේ බලපෑම් අවම කර ගනිමින් ජීවිත හා දේපල හානි සිදු වීම අවම කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.
- ආර්ථික අංශයෙන් ස්ථාවර වීම හා ප්‍රජාවගේ මට්ටමින් ස්වයංපෝෂිත වීම ඉලක්ක කර ගනිමින් දිස්ත්‍රික්කය තුළ කෘෂිකාර්මික කටයුතු නව්‍යකරණයට ලක් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- දිස්ත්‍රික්කය තුල ප්‍රජාවගේ ආහාර සුරක්ෂිතතාව සහ යහපත් පෝෂණ තත්ත්වයන් සාක්ෂාත්කර ගැනීම උදෙසා ඒකාබද්ධ කෘෂිකර්මික ප්‍රවේශයක් ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- දිස්ත්‍රික්කයේ ව්‍යවසායකින්ගේ කටයුතු නව්‍යකරණය කිරීම හා ඔවුනට අවශ්‍ය නිසි මග පෙන්වීම් සිදු කිරීම් තුලින් අපනයන වෙලදපොල දක්වා දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයින් රැගෙන යාමේ ක්‍රමවේදයක් සකස් කිරීම.
- අරුණෝදය වැඩසටහන යටතේ දිස්ත්‍රික්කය පුරා පවතින සියලුම ග්‍රාම නිලධාරි වසම් නියෝජනය කරමින් ග්‍රාමීය මට්ටමින් තෝරා ගන්නා ලද පවුල් 2835 ක ප්‍රමාණයක් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම උදෙසා කටයුතු සිදු කිරීම.
- දිස්ත්‍රික්කය තුළ පවතින සංචාරක වටිනාකමක් සහිත ස්ථාන වැඩි දියුණු කිරීම තුලින් දේශීය විදේශීය සංචාරකයන්ගේ පැමිණීම වර්ධනය කිරීම.
- දිස්ත්‍රික්කය තුළ පවතින්නා වූ ඌණ උපයෝජිත ඉඩම් නිසි පරිදි පරිහරණය උදෙසා කටයුතු සකස් කිරිමෙන් භූමි පරිභෝජන ඵලදායිතාවය වර්ධනය කිරීම.
- ඩිජිටල්කරණය පාදක කර ගනිමින් මහජනතාව උදෙසා සේවා සැලසීම කාර්යක්ෂම කිරීම.
- වතු ප්‍රජාවගේ වෘත්තීය හා විධිමත් අධ්‍යාපනයේ ගුණත්වය වර්ධනය උදෙසා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- වතු ප්‍රජාවගේ සමාජ, ආර්ථික, දේශපාලනික සාක්ෂරතාවය වර්ධනය කිරීම උදෙසා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ස්වාභාවික පරිසරය, ජලපෝෂක ප්‍රදේශ, භූමිය හා ජෛව විවිධත්වය ආරක්ෂා කරගැනිම උදෙසා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.



පණ්ඩුක ශ්‍රී ප්‍රභාත් අබේවර්ධන

දිස්ත්‍රික් ලේකම් / දිසාපති,

බදුල්ල

# 03 පරිච්ඡේදය

## වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

**3.1** මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

**3.2** මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**3.3** මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**3.4** මූල්‍ය ප්‍රකාශ සටහන්

**3.5** ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

**3.6** වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගීකර ගැනීමේ කාර්යසාධනය

**3.7** මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

**3.8** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

**3.9** විගණකාධිපතිවරයාගේ වාර්තාව

# 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු. | | සටහන | සත්‍ය 2023 රු. | සත්‍ය 2022 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 4,497,402,360 | 4,093,327,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 414,935,949 | 255,885,990 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 69,113,927 | 65,021,846 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 4,981,452,237 | 4,414,234,835 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 4,981,452,237 | 4,414,234,835 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | 7,000,000 | 49,938,000 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 4,974,452,237 | 4,364,296,835 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | ඒසීඒ-2(ii) |
| - | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 964,452,375 | 795,622,763 | ඒසීඒ-2(ii) |
| - | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 140,093,999 | 110,779,096 | ඒසීඒ-2(ii) |
| - | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 280,833,059 | 12,297,452 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | ඒසීඒ-2(ii) |
| - | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 1,385,379,433 | 918,699,311 | |
| | මූලධන වියදම් | | | | |
| - | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 22,550,440 | 18,676,179 | ඒසීඒ-2(ii) |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 83,497,029 | 33,302,066 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| - | හැකියා වර්ධනය | 14 | 195,195 | 207,765 | ඒසීඒ-2(ii) |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | 321,242,432 | ඒසීඒ-2(ii) |
| - | මුළු මූලධන වියදම් (උ) | | 106,242,664 | 373,428,442 | |
| | තැන්පතු ගෙවීම් | | 474,437,258 | 301,491,444 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 71,039,476 | 53,282,305 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 545,476,734 | 354,773,749 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 2,037,098,831 | 1,646,901,502 | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | 2,937,353,405 | 2,717,395,333 | |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | 2,937,353,405 | 2,717,395,333 | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | - | - | ඒසීඒ-3 |

22 FEB 2024

# 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

## 2023 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | තත්‍ය 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 2,788,508,113 | 2,697,975,039 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම | ඒසීඒ-5/5(ඒ) | 180,992,894 | 179,067,346 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම | | **2,969,501,007** | **2,877,042,385** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම | | 40,654,100 | (20,772,757) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 2,788,508,113 | 2,697,975,039 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම | ඒසීඒ-4 | 140,338,794 | 199,840,103 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| මුළු වගකීම | | **2,969,501,007** | **2,877,042,385** |

පිටු අංක 7 සිට 23 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම පිටු අංක 24 සිට 61 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි<br>ප්‍රදීප් යසරත්න<br>ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br>දිනය : 2024.02. 20 | ගණන්දීමේ නිලධාරි<br>පණ්ඩුක ශ්‍රී ප්‍රභාත් අබේවර්ධන<br>දිස්ත්‍රික් ලේකම්<br>දිනය : 2024.02. 18 | ප්‍රධාන ගණකාධිකාරි (වැ. බ)<br>ජේ. එම්. පී. සිරිවර්ධන<br>දිනය : 2024.02. 18 |
| ප්‍රදීප් යසරත්න<br>ලේකම්<br>රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය<br>(ස්වදේශ කටයුතු අංශය)<br>"...ල මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05. | පණ්ඩුක ශ්‍රී ප්‍රභාත් අබේවර්ධන<br>දිස්ත්‍රික් ලේකම්/දිසාපති<br>බදුල්ල. | ජේ.එම්.පී. සිරිවර්ධන<br>ප්‍රධාන ගණකාධිකාරි(වැ.බ)<br>බදුල්ල දිස්ත්‍රික් ලේකම් වෙනුවට |

2

# 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහ | |
|---|---|---|
| | 2023<br>රු. | 2022<br>රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 186,931,818 | 212,718,848 |
| අග්‍රිම ලැබීම | 4,497,402,360 | 4,093,327,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 89,773,697 | 81,717,762 |
| තැන්පතු ලැබීම | 414,935,999 | 256,129,354 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | 5,189,043,874 | 4,643,892,964 |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,101,009,249 | 905,164,359 |
| සහනාධාර සහ මාරුකිරීම් | 280,833,059 | 12,297,452 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 3,103,063,227 | 2,928,121,915 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 7,000,000 | 49,938,000 |
| අත්තිකාරම් ගෙවීම | 116,458,366 | 73,396,714 |
| තැන්පතු ගෙවීම | 474,437,308 | 301,546,083 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | 5,082,801,210 | 4,270,464,523 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | 106,242,664 | 373,428,441 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපකරණ අයකර ගැනීම | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම | 106,242,664 | 373,428,441 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | 106,242,664 | 373,428,441 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | (106,242,664) | (373,428,441) |
| **+ (ඊ)** | 0 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම | - | - |
| විදේශීය ණය ගැනීම | - | - |
| ප්‍රදානයන් ලැබීම | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම** | | |
| දේශීය ණය ආපසු ගෙවීම | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

3

# 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමෙ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

ඒසීඒ -2

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

**වියදම් ශීර්ෂ අංකය : 276**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

රු.

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වියදමෙහි නම | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම් (3) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | මුළු වියදම (5) | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම) (6)=(4)-(5) |
|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන (1) | (1) පුනරාවර්තන | 1,194,000,000 | 277,207,000 | | 1,471,207,000 | 1,385,379,433 | 85,827,567 |
| | | | | | - | | - |
| | (2) ප්‍රාග්ධන | 127,000,000 | | | 127,000,000 | 106,242,664 | 20,757,336 |
| | | | | | - | | - |
| | උප එකතුව | 1,321,000,000 | 277,207,000 | - | 1,598,207,000 | 1,491,622,098 | 106,584,902 |
| වැඩසටහන (2) | (1) පුනරාවර්තන | | | | | | |
| | (2) ප්‍රාග්ධන | | | | | | |
| | උප එකතුව | - | - | - | - | - | - |
| | මුළු එකතුව | 1,321,000,000 | 277,207,000 | - | 1,598,207,000 | 1,491,622,098 | 106,584,902 |

.................................................

ජේ. එම්. පි. සිරිවර්ධන
ප්‍රධාන ගණකාධිකාරී (වැ.බ)
දිනය : 2024/02/18

ජේ.එම්.පි. සිරිවර්ධන
ප්‍රධාන ගණකාධිකාරී වැ.බ.
බදුල්ල දිස්ත්‍රික් ලේකම් කෙ...

7

ඊසීඊ - 2(i)

## වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 276

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : බදුල්ල

රු.

| වැය විෂයය | වැඩසටහන (1) | | | | | වැඩසටහන (2) | | | | | මුළු වියදම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදනය | | | | වියදම | ප්‍රතිපාදනය | | | | වියදම | |
| | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරුකිරීම් (3) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | (5) | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7) | මු.රෙ. 66/69 මාරුකිරීම් (8) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8) | (10) | (11)=(5)+(10) |
| පුනරාවර්තන වියදම් | | | | | | | | | | | |
| පුද්ගල පඩිනඩි | | | | | | | | | | | |
| 1001 වැටුප් හා වේතන | 672,000,000 | | | 672,000,000 | 641,270,546 | | | | | | 641,270,546 |
| 1002 අතිකාල හා නිවාඩු දින වැටුප් | 26,500,000 | | (1,800,000) | 24,700,000 | 19,616,873 | | | | | | 19,616,873 |
| 1003 වෙනත් දීමනා | 320,000,000 | | | 320,000,000 | 303,564,956 | | | | | | 303,564,956 |
| ගමන් වියදම් | | | | - | | | | | | | - |
| 1101 දේශීය | 17,200,000 | | 3,750,000 | 20,950,000 | 19,954,053 | | | | | | 19,954,053 |
| සැපයීම් | | | | - | | | | | | | - |
| 1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 28,600,000 | | | 28,600,000 | 24,421,307 | | | | | | 24,421,307 |
| 1202 ඉන්ධන | 30,300,000 | | | 30,300,000 | 26,903,111 | | | | | | 26,903,111 |
| 1203 ආහාර පාන හා නිල ඇඳුම් | 3,050,000 | | (235,000) | 2,815,000 | 2,636,500 | | | | | | 2,636,500 |
| නඩත්තු වියදම් | | | | - | | | | | | | - |
| 1301 වාහන | 21,000,000 | | (1,540,000) | 19,460,000 | 13,239,228 | | | | | | 13,239,228 |
| 1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 4,000,000 | | 500,000 | 4,500,000 | 4,241,468 | | | | | | 4,241,468 |
| 1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,900,000 | | 600,000 | 2,500,000 | 2,405,786 | | | | | | 2,405,786 |
| සේවා | | | | - | | | | | | | - |
| 1401 ප්‍රවාහන | 600,000 | | | 600,000 | 600,000 | | | | | | 600,000 |
| 1402 තැපැල් හා සන්නිවේදන | 15,500,000 | | (350,000) | 15,150,000 | 14,109,709 | | | | | | 14,109,709 |
| 1403 විදුලිය හා ජලය | 19,500,000 | | (400,000) | 19,100,000 | 12,919,306 | | | | | | 12,919,306 |
| 1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 350,000 | | 150,000 | 500,000 | 347,137 | | | | | | 347,137 |
| 1409 වෙනත් | 24,700,000 | | (675,000) | 24,025,000 | 18,316,394 | | | | | | 18,316,394 |
| මාරුකිරීම් | | | | - | | | | | | | - |
| 1504 සංවර්ධන සහනාධාර | | 277,207,000 | | 277,207,000 | 273,936,156 | | | | | | 273,936,156 |
| 1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොලී | 8,800,000 | | | 8,800,000 | 6,896,904 | | | | | | 6,896,904 |
| මුළු එකතුව | 1,194,000,000 | 277,207,000 | - | 1,471,207,000 | 1,385,379,433 | - | - | - | - | - | 1,385,379,433 |

8

ජසිර - 2(i)

## වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය : 276

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : බදුල්ල

රු.

| වැය විෂයය | වැඩසටහන (1) ප්‍රතිපාදනය | | | | | වැඩසටහන (2) ප්‍රතිපාදනය | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරුකිරීම් (3) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | වියදම (5) | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (6) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (7) | මු.රෙ. 66/69 මාරුකිරීම් (8) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (9)=(6)+(7)+(8) | වියදම (10) | මුළු වියදම (11)=(5)+(10) |
| මූලධන වියදම් | | | | | | | | | | | - |
| <u>මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම</u> | | | | | | | | | | | - |
| 2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 10,000,000 | | | 10,000,000 | 9,617,352 | | | | | | 9,617,352 |
| 2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 4,800,000 | | | 4,800,000 | 4,488,676 | | | | | | 4,488,676 |
| 2003 වාහන | 10,000,000 | | | 10,000,000 | 8,444,412 | | | | | | 8,444,412 |
| <u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u> | | | | - | | | | | | | - |
| 2102 ගෘහභාණ්ඩ හා කාර්යාලීය | 1,000,000 | | | 1,000,000 | 990,654 | | | | | | 990,654 |
| 2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,000,000 | | | 1,000,000 | 999,750 | | | | | | 999,750 |
| 2104 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 100,000,000 | | | 100,000,000 | 81,506,625 | | | | | | 81,506,625 |
| <u>හැකියා වර්ධනය</u> | | | | - | | | | | | | - |
| 2401 කාර්ය මණ්ඩල පුහුණු | 200,000 | | | 200,000 | 195,195 | | | | | | 195,195 |
| | | | | - | | | | | | | |
| මුළු එකතුව | 127,000,000 | - | - | 127,000,000 | 106,242,664 | - | - | - | - | - | 106,242,664 |
| | | | | | | | | | | | |
| මුළු පුනරාවර්තන හා මූලධන වියදම්වල එකතුව | 1,321,000,000 | 277,207,000 | - | 1,598,207,000 | 1,491,622,098 | - | - | - | - | - | 1,491,622,098 |

* අදාළ වැය විෂයයන් පමණක් ඇතුළත් කර ආකෘතිය සංශෝධනය කර ගත යුතු ය.

..................................................
ජේ. එම්. පි. සිරිවර්ධන
ප්‍රධාන ගණකාධිකාරි (වැ.බ)
දිනය : 2024/02/18

ජේ.එම්.පි. සිරිවර්ධන
ප්‍රධාන ගණකාධිකාරි (වැ.බ)
බදුල්ල දිස්ත්‍රික් ලේකම් කෙටුව

## 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

ඒසිඑ - 2(ii)

වියදම් ශීර්ෂ අංකය : 276

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : බදුල්ල

රු.

| වැය විෂයය | සටහන | මූලාශ්‍රකරණ සංකේත අංකය | ප්‍රතිපාදනය: වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන | ප්‍රතිපාදනය: පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | ප්‍රතිපාදනය: මු.රෙ. 66/69 මාරු කිරීම | ප්‍රතිපාදනය: මුළු ශුද්ධ ප්‍රතිපාදන | වියදම: මුදල් පොතට අනුව වියදම | වියදම: මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) | වියදම: මුළු වියදම | ශුද්ධ බලපෑම: ඉතිරිය / (ඉක්මවීම) | ශුද්ධ බලපෑම: ඉතිරිය / (ඉක්මවීම) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස | ශුද්ධ බලපෑම: වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | (1) | (2) | (3) (-)/+ | (4)=(1)+(2)+(3) | (5) | (6) | (7)= (5)+(6) | (8)=(4)-(7) | (9)=(8)/(4)*100 | |
| පුනරාවර්තන වියදම් | | | | | | | | | | | | |
| වැඩසටහන (1) | | | | | | | | | | | | |
| වැඩසට./ව්‍යාපෘ./උප ව්‍යාපෘ./වැය විෂයය අංකය | | | | | | | | | | | | |
| වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | | 1,018,500,000 | - | (1,800,000) | 1,016,700,000 | 960,915,250 | 3,537,125 | 964,452,375 | 52,247,625 | | |
| පුද්ගල පඩිනඩි | | | | | | | | | | | | |
| 1001 වැටුප් හා වේතන | | 11 | 672,000,000 | | | 672,000,000 | 641,270,546 | | 641,270,546 | 30,729,454 | 4 | |
| 1002 අතිකාල හා නිවාඩු දින වැටුප් | | 11 | 26,500,000 | | (1,800,000) | 24,700,000 | 19,616,873 | | 19,616,873 | 5,083,127 | 21 | අයවැය චක්‍රලේඛ 1/2023 ප්‍රකාරව රාජ්‍ය වියදම් කළමනාකරණය |
| 1003 වෙනත් දීමනා | | 11 | 320,000,000 | | | 320,000,000 | 300,027,831 | 3,537,125 | 303,564,956 | 16,435,044 | 5 | අයවැය චක්‍රලේඛ 1/2023 ප්‍රකාරව රාජ්‍ය වියදම් කළමනාකරණය |
| වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | | 166,700,000 | - | 1,800,000 | 168,500,000 | 140,093,999 | | 140,093,999 | 28,406,001 | | |
| ගමන් වියදම් | | | | | | | | | | | | |
| 1101 දේශීය | | 11 | 17,200,000 | | 3,750,000 | 20,950,000 | 19,954,053 | | 19,954,053 | 995,947 | 5 | අයවැය චක්‍රලේඛ 1/2023 ප්‍රකාරව රාජ්‍ය වියදම් කළමනාකරණය |
| එකතුව (අ) | | | 17,200,000 | - | 3,750,000 | 20,950,000 | 19,954,053 | - | 19,954,053 | 995,947 | | |
| සැපයීම් | | | | | | | | | | | | |
| 1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | | 11 | 28,600,000 | | | 28,600,000 | 24,421,307 | | 24,421,307 | 4,178,693 | 15 | අයවැය චක්‍රලේඛ 1/2023 ප්‍රකාරව රාජ්‍ය වියදම් කළමනාකරණය |
(ඈ) රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් විසින් වෙලම්පැලේ ග්‍රාම නිලධාරී වසමේ කුඩාඔය ගමෙහි TOPOPP 72 හි රජයේ ඉඩම ලෙස දක්වා ඇති අක්කර 30 ක (හෙක්ටයාර් 7.235) පමණ ඉඩම් කොටසෙහි පුද්ගලික ආයතනයකට සූර්ය විදුලි බලාගාරයක් ඉදි කිරීම සඳහා 2020 වර්ෂයේ දී අවසර ලබා දී තිබුණි. ඒ අනුව මෙගාවොට් 06 ක ධාරිතාවයකින් යුතු සූර්ය බලශක්ති බලාගාරයේ සූර්ය පැනල පද්ධතිය ඉදිකිරීම ඇතුළු බලශක්ති පද්ධතිය සකස් කිරීමේ කටයුතු අවසන් කර 2022 අගෝස්තු 20 වන ජාතික විදුලි බල පද්ධතියට විදුලිය සැපයීමද ආරම්භ කර තිබුණි. විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 08 දින වන විට වර්ෂ තුනකට ආසන්න කාලයක් අදාල පුද්ගලික ආයතනය විසින් නීත්‍යානුකූල අයිතියක් නොමැතිව රජයේ ඉඩම් භුක්ති විඳිමින් සිටින බවත් දීර්ඝ කාලීන බදුකරයක් නිකුත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් රජයට ලැබිය යුතු බදු ආදායම අහිමි වී ඇති බවත් නිරීක්ෂණය විය.

(ඉ) ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මඩුවත්ත හා ඇකිරිය ග්‍රාම නිලධාරී වසම්වල පවත්වාගෙන යනු ලබන පුද්ගලික සමාගම් දෙකකට අයත් කුඩා ජල විදුලි බලාගාර 03 ක් සඳහා ජල බලපත්‍ර නිකුත් නොකිරීම හේතුවෙන් 2008 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රජයට හිමිවිය යුතු රු.9,660,000 ක ජල හැරවුම් බදු ආදායම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි.

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) ACA-2(iv)- වැඩසටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශ ආකෘතියේ වැඩසටහන් 01 හි සත්‍ය වියදම රු.1,491,622,098 ක් වුවද ACA-2(v) - එක් එක් වැඩසටහන් යටතේ ව්‍යාපෘති අනුව වියදම් මූල්‍යකරණ සාරාංශ ආකෘතියේ දක්වා ඇති ඉහත වැඩසටහන යටතේවූ ව්‍යාපෘති 03 හි සත්‍ය වියදම්වල එකතුව රු.1,488,084,973 ක් වුයෙන් රු.3,537,125 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) යම් කිසි වැය විෂයයක් සඳහා ප්‍රතිපාදන සලසනු ලබනුයේ ඒ යටතේ වියදම් දැරීමේ අපේක්ෂාවෙන් කරනු ලබන ප්‍රතිපාදන ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් වුවත් වැය විෂයයන් 06 ක් සඳහා වෙන් කරන ලද රු.110,250,000 ප්‍රතිපාදනයෙන් සියයට 2 සිට 8 දක්වා ප්‍රතිශතයක් වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබුණි.

(ඇ) තාත්වික ලෙස ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 04 ක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සලසා තිබූ රු.23,450,000 ක ප්‍රතිපාදනවලට අමතරව රු.5,000,000 ක් වූ ප්‍රතිපාදන, මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන්ගෙන් මාරු කරගෙන තිබුණු අතර එය ප්‍රතිපාදන මුදල මෙන් සියයට 13 සිට සියයට 43 ක් දක්වා වූ ප්‍රතිශතයක් විය.

(ඈ) මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව වියදම් ශීර්ෂයක් තුල වැඩසටහනක්, ව්‍යාපෘතියක්, වැය විෂයයක් හෝ වැය විෂයයන් සඳහා ඇස්තමේන්තුවල වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන මුදල් වර්ෂය තුල වියදම් කිරීමට ප්‍රමාණවත් නොවන බව හා එම ප්‍රතිපාදන වල සීමාව ඉක්මවා යැමට ඉඩ ඇති බව පෙනී යන විට පමණක් යම් වැඩසටහනක ව්‍යාපෘතියක හෝ වැය විෂයයක ඉතිරි කිරීම් මාරු කරගැනීමට කටයුතු කල යුතු වුවද වැය විෂයයන් 04 ක් සඳහා මාරුකර ගත් රු.23,450,000 ක ප්‍රතිපාදනවලින් සියයට 16 සිට 100 ක් වූ ප්‍රතිශතයක් උපයෝජනය කර නොතිබුණු අතර අංක 276-1-1-0-1404 දරන වැය විෂයය යටතේ මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කරගත් ප්‍රතිපාදනය මෙන් සියයට 102 ක් ඉතිරි වී තිබුණි.

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව (ඇමුණුම-(iii)) 2023 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් කිසිවක් නොමැති බව දක්වා තිබුණ ද, සිදුකරන ලද පසු නිරවුල් කිරීම් පිළිබඳ නියැදි පරීක්ෂාවේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2024 ජනවාරි හා පෙබරවාරි මාසවල දී 2023 වර්ෂයට අදාළව රු.1,882,381 ක වියදම් වවුචර් 78 ක් මගින් ගෙවා තිබුණු අතර බඳුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024 ජනවාරි හා පෙබරවාරි මාසවල දී 2023 වර්ෂයට අදාළව රු.47,035 ක් වවුචර් 24 ක් මගින් ගෙවා තිබුණි. මෙම ගෙවීම් 2023 දෙසැම්බර් 31 දිනට බැරකම් ලෙස ඇමුණුම-(iii) හි දක්වා නොතිබුණි.

## 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) ඌව පළාත් සභාවේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රු.1,503,027 ක ප්‍රතිපාදන මත 2021 වර්ෂයේ දී රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටුකරන ලද රිදීමාලියද්ද පශු වෛද්‍ය කාර්යාලය අළුත්වැඩියා කිරීමේ කර්මාන්තය (අදියර 01) පරීක්ෂා කිරීමේදී කොන්ත්‍රාත්කරු විසින් ඇස්තමේන්තුවේ සඳහන් රු.603,092 ක වටිනාකමක් සහිත වැඩ විෂයයන් 29 ක් ඉටුකර නොතිබුණු බවත් අවසන් බිල්පත්‍රයෙහි එකතුව රු.320,668 ක් ගෙවා අවසන් කරන ලද වැඩ විෂයයන් 05 ක් ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි ඉටුකර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

(ආ) ඌව පළාත් ඉඩම් කොමසාරිස් වෙතින් ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත 2022 දෙසැම්බර් 12 දින ජල රක්ෂිත සංරක්ෂණය සඳහා ලැබී තිබුණු රු.200,000 ක යුනිසෙෆ් මූල්‍යාධාර විගණිත දිනය වූ 2023 සැප්තැම්බර් දක්වාම අදාල කාර්යයට යොදවා නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 2.5 ගණන් දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන් දීමේ නිලධාරී විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.6 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | |
| 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 25(1) හා 25(5) (ආ) වගන්තිය | තොරතුරු දැනගැනීම සඳහා ඉල්ලීමක් ලැබී වැඩකරන දින 14 ක් තුල හෝ යම් ප්‍රමාදයක් වේ නම් 25(5) (ආ) වගන්තිය අනුව දින 21 කට නොවැඩි කාලයක් තුල අදාල ඉල්ලීම සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් වෙත 2017 සිට 2023 කාලපරිච්ඡේදය තුල ලද තොරතුරු දැනගැනීමේ අයදුම්පත් 15 ක් සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලීම් සම්පූර්ණ කර නොතිබුණි. . |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| XIX පරිච්ඡේදයේ 6.1 වගන්තිය | පොදු සේවා නිල නිවාසයක උපරිම පදිංචි කාලය වසර 05 ක් විය යුතු වුවද ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලට අයත් පැරණි උසාවි ගොඩනැගිල්ල නිල නිවාසයක් ලෙස භාවිතා කරමින් සිටි නිලධාරියා වසර 19 ක කාලයක් අඛණ්ඩව එහි පදිංචිව සිට තිබුණි. |
| **(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | |
| (i) රාජ්‍ය පරිපාලන හා කලමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින්ම පසුව හෝ කිලෝමීටර් 25000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහන පරීක්ෂාවක් කල යුතු වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් යටතේ පවතින වාහන 32 ක් සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක 14/2022 හා 2022 නොවැම්බර් 10 දිනැති චක්‍රලේඛය හා අංක HA/02/23 දරන 2023 නොවැම්බර් 28 දිනැති ලිපිය | සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් විසින්ම නිවාඩු හැර අනෙකුත් කාර්යයන් සඳහා SYSCGAA පද්ධතිය අදාළ කර ගත යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07ක් විසින් SYSCGAA කාර්යාල කලමනාකරණ පද්ධතිය භාවිතා නොකරන බව නිරීක්ෂණය විය. |

(ඈ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ

| | |
|---|---|
| 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4 ඡේදය | 2018 වර්ෂය සහ ඉදිරි වර්ෂවල විශ්‍රාම / මරණ පාරිතෝෂික ලබාදී ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු කිසිදු ණය ශේෂයක් තම ආයතන වල අත්තිකාරම් "බී" ගිණුමේ ඇතුලත් නොවීමට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාලව, සේවය කර විශ්‍රාම ගොස් තිබුණු හා මියගොස් තිබුණු නිලධාරීන් 04 ක ගෙන් වසර 1 සිට වසර 10 දක්වා කාලයක සිට අයවිය යුතු එකතුව රු.513,457 ක ණයශේෂ අයකර නොගෙන අත්තිකාරම් "බී" ගිණුමේ දක්වා තිබුණි. |
| (ඉ) **2023 වර්ෂයේ ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියෙහි 2.2.2** සහ **2.2.3 ඡේදයන්** | එක් සේවා ස්ථානයක වසර 05 කට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් විය යුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් 10 ක් වසර 06 සිට වසර 10 දක්වා කාලයක් එකම සේවා ස්ථානයක සේවය කරමින් පැවතුණි. |

## 2.7 අවිධිමත් ගනුදෙනු

රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 42 න් 18 ක සමෘද්ධි අතිරේක දීමනාව (Top up ) ලැබූ ප්‍රතිලාභීන් 6,504 කින් 2,811 ක නියැදියක් තෝරා ගෙන 2022 මැයි මාසය සඳහා සිදුකල ගෙවීම් පිළිබඳව පරීක්ෂාවේදී වැඩිහිටි දීමනාව, වකුගඩු දීමනාව හෝ ආබාධිත දීමනාව යටතේ අතිරේක දීමනාව ලබන නමුත් සමෘද්ධි සහනාධාරය යටතේද අතිරේක දීමනාව ගෙවීම හේතුවෙන් ද්විගණනයට ලක්වූ ප්‍රතිලාභීන් 265 ක් වෙත අතිරේක දීමනාව ලෙස රු.736,500 ක් වැඩිපුර ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

## 2.8 තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පොදු තැන්පත් ගිණුම් 02 කට බැරකරන ලද එකතුව රු.202,814 ක මුදලක් ගෙවීම් කර වර්ෂ 02 කට වැඩි කාලයක් ගතවී තිබුණද, සිගාස් පද්ධතියෙන් ඉවත් කර ගැනීම 2023 දෙසැම්බර් 31 දින වන විටද සිදුකර නොතිබුණි.

(ආ) 2017 ජූලි 29 වන දින අනතුරට පත් රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහනය අළුත්වැඩියා කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සමාගම විසින් 2019 දෙසැම්බර් 20 දින ලබාදී තිබුණු රු.2,500,000 ක මුදල වර්ෂයේ ආදායම් ලැබීම් ලෙස හඳුනා ගැනීම වෙනුවට එය පොදු තැන්පත් ගිණුමට බැරකර තිබුණු අතර රක්ෂණය මගින් ප්‍රතිපූරණය නොකල රු.3,849,333 ක අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර නොතිබුණි.

(ඇ) ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ස්වභාවික ආපදාවන්ට ලක්වූවන් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ නිවාස ඉදි කිරීම සඳහා ලබා දුන් වාරික මුදලින් රු.150,000 ක් වර්ෂ 2 ත් 5 ත් අතර කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණු අතර අදාල ප්‍රතිලාභීන් සඳහා ඉදිවෙන නිවාස වල වැඩ අවසන් කර පදිංචි කිරීම 2023 දෙසැම්බර් 31 දින වන විටත් සිදු කර නොතිබුණි.

(ඈ) ලුණුගල ප්‍රාදේශීය සභාව විසින් සකසා තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයට යොමු කරන ලද ඇස්තමේන්තුවට අනුව වැඩ ආරම්භ කරන ලද වොලිබෝල් ක්‍රීඩා පිටියක් ඉදිකිරීමේ කර්මාන්තයේ ඇස්තමේන්තුව පරිදි විදුලි සැපයුම් ලබා නොදීම හේතුවෙන් නිදහස් කර නොමැති රු.147,059 ක රැඳවුම් මුදල අදාල කාර්යය ඉටු කරවා ගෙන කොන්ත්‍රාත්කරුට නිදහස් කිරීමට හෝ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නිරවුල් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඉ) ඉඩම් අත්පත් කර ගත් ප්‍රතිලාභීන්ගේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිරවුල් කර වන්දි ලබා දීම සිදු නොකර රු.39,429,295 ක ඉඩම් අත්පත් කර ගැනීමේ වන්දි මුදල් වර්ෂ 5 කට වැඩි කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

2.9 අධිභාර

කාර්යාලයේ සියළු නිල රාජකාරි කටයුතු සඳහා සංචිත වාහනයක් භාවිතා කර ඒ සඳහා ඉන්ධන ඇනවුම් මගින් ඉන්ධන ලබාගෙන තිබියදී 2022 පෙබරවාරි සිට 2023 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය තුල කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නිරත වූ ප්‍රාදේශීය ලේකම්වරු දෙදෙනෙකු විසින් රු.812,460 ක ඉන්ධන දීමනාද ලබාගෙන තිබුණු අතර මුදල් රෙගුලාසි 119 අනුව වැඩිපුර ගෙවූ ඉන්ධන දීමනාව 2023 දෙසැම්බර් 31 දින වන විට ද අයකරගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතු අතර ඒ සඳහා භාවිතා කල යුතු ආකෘති පත්‍ර හා දත්ත ඇතුලත් කිරීමේ මාර්ගෝපදේශ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් ලබාගත යුතුව තිබුණු නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි උක්ත මාර්ගෝපදේශයන්ට අනුකූල නොවන පරිදි කටයුතු කර තිබුණු අවස්ථා 06 ක් නිරීක්ෂණය විය.

3.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Out come) ලබා නොගැනීම

සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය -2021

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් උක්ත ව්‍යාපෘතිය යටතේ රු.10,227,818 ක් වැයකර ග්‍රාම නිලධාරි කොට්ඨාශ 02 ක් ආවරණය වන පරිදි ප්‍රතිලාභී පවුල් 183 ක් තෝරාගෙන, හරිතාගාර තුල මල් හා එළවළු වගාකිරීම, කුකුල් පාලනය, එළුවන් පාලනය හා මී මැසි පාලනය යන ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතිය තුලින් ප්‍රතිලාභියෙකුගේ මාසික සාමාන්‍ය ආදායම රු.30,000 - 40,000 ත් අතර මට්ටමකට ලගා කරවීම ව්‍යාපෘතියේ ප්‍රධානතම ඉලක්කය වුවද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු ප්‍රතිලාභියෙකුගේ මාසික සාමාන්‍ය ආදායම රු.500 ත් 3500 අතර මට්ටමක පැවතීම හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ආදායම් ඉලක්කයන් ලගාකරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ තෝරාගන්නා ලද ප්‍රතිලාභීන් 92 ක් වෙත රු.4,048,000 ක් වැයකර කිකිළි පැටවුන් 9,200 ක්ද රු.5,391,472 ක් වැයකර උපකරණ ඇතුළු කුඩු ඉදිකිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍යද ලබාදී තිබුණි. එම කිකිළි පැටවුන් 9,200 ක් අතරින් විගණිත දිනය වූ 2023 දෙසැම්බර් 08 වන විට කිකිළි පැටවුන් 7,371 ක සංඛ්‍යාවක් මියගොස් හෝ විකුණා තිබුණි. එම සංඛ්‍යාව ලබාදුන් කිකිළි පැටවුන් ගණනින් සියයට 80 ක් පමණ වූ අතර ඒ සඳහා රජය වැයකල රු.3,243,240 ක මුදල නිෂ්ඵල වියදමක් බවට පත්වී තිබුණි.

(ඇ) (i) ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ රු.5,944,977 ක් වැයකර 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද බතික් හා අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන හා ඒ ආශ්‍රිත නිමි ඇඳුම් සකස් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 02 කට ආසන්න කාලයක් ගතවී තිබුණද, මෙ දක්වාද ව්‍යාපෘතිය ආරම්භක අවධියේ පසුවන බව නිරීක්ෂණය විය. තවද ව්‍යාපෘති වාර්තාව අනුව සංචාරකයින් ඉලක්ක කරගත් නිෂ්පාදන බිහිකිරීම, අපනයන වෙළඳපල ඉලක්ක කරගත් නිෂ්පාදන ඇතිකිරීම ඇතුළු අනෙකුත් අරමුණු සඵලදායී ලෙස ඉටුකරගෙන නොමැති බව නිරීක්ෂණය වූ අතර එම අරමුණු ඉටුකරගැනීම සඳහා වූ ක්‍රියාකාරි සැලැස්මක්ද 2023 වර්ෂය සඳහා සකස් කර නොමැති බවත් නිරීක්ෂණය විය. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ ගැටළු සඳහා ඵලදායී විසඳුමක් ලබාදීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අපොහොසත් වන්නේ නම් ප්‍රතිලාභීන් ව්‍යාපෘතියෙන් ඉවත් වීමේ අවධානමක් පවතින බවත් වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ii) ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ බතික් හා අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන හා ඒ ආශ්‍රිත නිමි ඇඳුම් සකස් කිරීමේ ව්‍යාපෘතිය සඵලදායී ලෙස සැලසුම් කර ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රු.1,283,024 ක් වැයකර මිලදී ගෙන තිබුණු රෙදි පින්තාරු කිරීමේ උපකරණවලින් උපකරණ 35 ක් විගණිත දිනය වූ 2023 සැප්තැම්බර් 06 වන විටද භාවිතයට නොගෙන ඌණ උපයෝජිතව මධුරගම රෙදි පින්තාරු කිරීමේ ගොඩනැගිල්ලේ තබා තිබුණි.

(ඈ) පස්සර හා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ පිළිවෙලින් රු.7,139,063 ක් හා රු.7,255,335 ක මහජන මුදල් වැයකර 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු මඩුගස්තලාව හා ගල්වෙලගම කිතුල් ගම්මානයන් බිහිකිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 02 කට කාලයක් අවසන් වුවද අපේක්ෂිත අරමුණු සඵලදායී ලෙස ලඟාකර ගෙන නොතිබුණි. රජය

විසින් වැය කල මුදලට සාපේක්ෂව ප්‍රතිදානයක් (out come ) ලබා ගැනීමට අපොහොසත් වී ඇති බවත්, සාම්ප්‍රදායිකව කිතුල් කර්මාන්තයේ නියැලෙන පවුල් 212 ක් තෝරාගෙන උපකරණ ලබාදීමත්, පුහුණු අවස්ථාවන් කිහිපයක් ලබාදීමත් හැර වාණිජ මට්ටමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට හා ජාතික නිෂ්පාදනය වැඩිකර ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා දායකවීමට ව්‍යාපෘතිය අපොහොසත් වී ඇති බවත් නිරීක්ෂණය විය.

### 3.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොටබක්ම ග්‍රාම නිලධාරි වසමේ 2014 වර්ෂයේදී නායයාමේ අධි අවදානමට ලක්වූ හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අවස්ථා තුනකදී පදිංචි ස්ථානවලින් ඉවත්කර නැවත පදිංචි කරවීම අනිවාර්ය කර තිබුණු පවුල් 134 ක් අවධානමට ලක්වී වර්ෂ 10 කට ආසන්න කාලයක් ගත වුවද විගණිත දිනය වූ 2024 පෙබරවාරි 08 වන විටද නැවත පදිංචි කිරීම සිදුකර නොතිබුණු අතර 2024 ජනවාරි වන විට හඳුනාගෙන ඇති ඉඩම තුල ප්‍රතිලාභීන්ට මූලික බිම් කට්ටි වෙන්කර දීම් හැර ඉඩම් අත්පත් කරගෙන ප්‍රතිලාභීන් නැවත පදිංචි කිරීම සඳහා සාධණීය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම අවධානමට ලක්වූ පවුල් 134 ක් මුල් ස්ථානවලම ජීවිත අවධානමක් දරාගනිමින් වර්ෂ 10 කට ආසන්න කාලයක් පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය.

(ආ) හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නායයාමේ අවධානමට යටත් ප්‍රදේශවල ජනතාව නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ දඹේතැන්න නිවාස ව්‍යාපෘතිය වර්ෂයක ගිවිසුම් කාලයක් තුළ අවසන් කිරීම සඳහා 2019 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.37,200,000 ක් රජයේ මුදල් වැය කර තිබුණි. නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ නිවාස ඉදිකිරීම සඳහා ලබාදී ඇති මාර්ගෝපදේශයේ උපදෙස් අනුව කටයුතු නොකිරීම, නිවාස සංවර්ධන අධිකාරිය සමග එළඹී ගිවිසුම අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2020 ඔක්තෝබර් 14 වන දින වන විට නිවාස ඉදිකරවා ගැනීමට අපොහොසත් වීම හා ව්‍යාපෘතිය වසරකට ආසන්න කාලයක් මුළුමනින්ම නවතා දැමීම මත, ගොඩනැගිලි ද්‍රව්‍ය වල මිල ගණන් ඉහල යාම, ඉදිකිරීමේ පිරිවැය ඉහල යාම, මූලික ඇස්තමේන්තු පිරිවැය වෙනස්වීම මගින් සිදුවූ මූල්‍ය හානිය අවසන් වශයෙන් ප්‍රතිලාභියාට දරා ගැනීමට සිදුවී තිබීම හේතුවෙන් ප්‍රතිලාභීන් දැඩි ලෙස අපහසුතාවයට පත්ව ඇති බවත් ඉදිකිරීම කාර්යක්ෂම ලෙස ඉටු කරවා ගැනීමට එය බාධාවක් වී ඇති

බවත් නිරීක්ෂණය විය. ඒ අනුව ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 04 කට වැඩි කාලයක් ගතවී ඇති නමුත් නායයෑමේ අවධානමට ලක්වූ පවුල් 65, අදාල ස්ථානවලම අවධානමක් දරා ගනිමින් පදිංචි වී සිටින බැවින් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නායයාමේ අවධානමට යටත් ප්‍රදේශවල ජනතාව නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩකොහොවිල අක්කර 100 යන ස්ථානයේ නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කිරීම 2020 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර ,සමාලෝචිත වර්ෂය අවසන් වන විට ප්‍රතිලාභීන් 37 ක් වෙනුවෙන් රු.29,200,000ක රජයේ මුදල් වැය කර තිබුණි.නමුත් මෙම නිවාස ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 03 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද නාය යෑමේ ඇඩි අවධානමට ලක් වී තිබුණු පවුල් 37 නැවත පදිංචි කිරීම සිදුකර නොතිබුණු අතර එම පවුල් මුල් ස්ථානවලම ජීවිත අවධානමක් දරා ගනිමින් පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය.

## 3.2 වත්කම් කලමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) World vision lanka ආයතනයෙන් රු.6,601,144 ක් වැයකර 2023 ජූනි මහියංගණය නගරය තුල ඉදිකරන ලද මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල මහියංගණය ප්‍රාදේශීය ලේකම් වෙත 2023 ජූනි මසදී භාර දී තිබුණ ද 2023 නොවැම්බර් 21 වන විටද අදාල ගොඩනැගිල්ල භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුනි.

(ආ) කන්දකැටිය හා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සුදු ගම්මිරිස් නිෂ්පාදන ව්‍යාපෘති සඳහා 2022 මැයි 20 හා 21 වන දිනවල ස්ථාපිත කරන ලද පිරිවැය රු.4,555,000 ක් වූ ගම්මිරිස් වියලන යන්ත්‍ර 02 ක් 2024 මාර්තු 31 දින වන විටත් ඌණ උපයෝජිතව පැවතුණි.

(ඇ) බදුල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම ශක්ති ජනතා සමිති 160 ක් සතු රු.44,898,005 ක අරමුදල් නිසි පරිදි කාර්යක්ෂමව ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්වය ඉහල නැංවීම සඳහා යොදවා නොගෙන නිශ්කාර්යව බැංකු ගිණුම්වල පවතින බව නිරීක්ෂණය විය.

## 3.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ලබාගෙන තිබුණු විශ්‍රාමිකයකු 2015 ඔක්තෝබර් 31 දින මිය ගියද විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය යාවත්කාලීන වී නොතිබීම හේතුවෙන් මියයාමෙන් පසුවද 2019 ජූනි 30 දින දක්වා එකතුව රු.1,412,812 ක විශ්‍රාම වැටුප් ඔහුගේ බැංකු ගිණුමට බැරවී තිබීමෙන් එම මුදල ඔහුගේ උරුමකරුවන් විසින් ලබාගෙන තිබුණු අතර ඉන් රු.300,484 ක මුදලක් 2023 දෙසැම්බර් 31 දින වන විටද නැවත අයකර ගෙන නොතිබුණි.

(ආ) බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාමිකාවක වෙත වැඩිපුර ගෙවන ලද රු.386,075 ක විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව උරුමකරුවන්ගෙන් අයකරගත යුතු වුවද එම මුදල ගෙවීමට නොහැකි බව උරුමකරුවන් විසින් 2024 මාර්තු 05 දින දැනුම් දී ඇති නමුත් මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් 2024 මාර්තු 31 දින වන විටත් ගෙන නොතිබුණි.

(ඇ) ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් 250-2069 කැබ් රථය අනතුරට ලක් වී වර්ෂ 08 කට පසු ඊට අදාල අලාභ හානිය රු.500,000 ක් ලෙස 2019 මැයි 15 දින තක්සේරු කර තිබුණු අතර මු.රෙ 104(4) පරීක්ෂණ වාර්තාව අනුව අනතුර සඳහා වගකිව යුතු පාර්ශවයන්ගෙන් එම අලාභය අයකර ගන්නා ලෙස නිර්දේශ කර තිබුණද 2024 මාර්තු 31 දින වන වන විට ද අයකර ගෙන නොතිබුණි. 2021 දෙසැම්බර් 26 දින මේ සම්බන්ධයෙන් නීතිපති උපදෙස් ඉල්ලා තිබීම හැර වෙනත් සාධනීය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ

(අ) ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව පළාත් සභාවකට නිලධාරීන් මාරු වී යන්නේ නම් එම පළාත් සභාවෙන් අදාල ණය මුදල් එකවර අයකර ගැනීමට කටයුතු කල යුතු අතර එසේ අයකර ගත නොහැකි නම් මාසික වාරික වශයෙන් හෝ අයකර ගැනීමට කටයුතු කල යුතු වුවද බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කර පළාත් සභා ආයතන වලට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු රු.882,843 ක ණය ශේෂයක් 2023 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගෙන

නොතිබුණි. එම ණය ශේෂයන් තුල වසර 10 ට වැඩි කාලයක සිට පැවත එන නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.223,327 ක ණය ශේෂයක් හා වසර 20 ට වැඩි කාලයක සිට පැවත එන නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.297,532 ක ණය ශේෂයක් ද ඇතුළත්ව තිබුණි.

(ආ) හපුතලේ, හාලිඇල හා රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නිරතව සිට වැඩ තහනමට ලක්වූ නිලධාරීන්/ සේවකයින් 03 දෙනෙකුගෙන් වසර 03 ත් 20 ත් අතර කාලයක සිට පැවත එන අයවිය යුතු රු.294,217 ක ණය ශේෂය ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තිය අනුව හා 2019 ජූනි 27 දිනැති අංක 05/2019 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 (ඉ) ඡේදය ප්‍රකාරව අයකර ගෙන නොතිබුණි.

(ඇ) ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවයේ නියුක්තව සිට සේවය අතහැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.84,675 ක ණය ශේෂයක් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.5 වගන්තිය අනුව හා 2019 ජූනි 27 දිනැති අංක 05/2019 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(ඉ) ඡේදය ප්‍රකාරව අයකර ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් මූලික වැටුප, ජීවන වියදම් දීමනා සහ පාරිතෝෂික වැඩිපුර ගෙවීම හේතුවෙන් විශ්‍රාමිකයන් 64 ක් වෙත රු.16,597,873 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර 2023 දෙසැම්බර් 31 වන විට එයින් ආපසු අයකර ගත යුතු මුදල රු. 9,081,544 ක් විය.තවද, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 3/2022 හා 2022 ජූනි 10 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 07 වගන්තිය අනුව විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් කටයුතු කල යුතු අතර ඒ සඳහා රජයේ මුදල් රෙගුලාසි අංක 101 සිට 113 දක්වා වූ විධිවිධාන හා ආයතන සංග්‍රහයේ 2 කාණ්ඩයේ විධිවිධානද ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අනුගමනය කල යුතු බව දක්වා ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 02 (i) ඡේදය හා 2023 මැයි 12 දිනැති අංක 2/2021 (viii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සියළුම රජයේ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම, ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතයෙන් සනාථ කල යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක මාණ්ඩලික නිලධාරීන් 17 ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් 04 විසින් මහජන දිනයේදී පමණක් ඇඟිලි සලකුණු යන්ත්‍රය මගින් පැමිණීම හා පිටවීම තහවුරු කරන බවත් අනෙකුත් කාර්යාලයේ රැඳී සිටින දිනවලදී ඇඟිලි

සලකුණු යන්ත්‍රය මගින් පැමිණීම හා පිටවීම තහවුරු නොකරන බවත් නියැදි පරීක්ෂාවන් වලදී නිරීක්ෂණය විය. තවද නියැදි පරීක්ෂාවට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක නිලධාරීන් 07 දෙනෙකු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් දෙදෙනෙකු දින 118 ක් සඳහා එලෙස පැමිණීම/පිටවීම සනාථ නොකල රජයේ නිවාඩු දිනවල රාජකාරියට වාර්තා කල බව සඳහන් කර ඒ සඳහා නිවාඩු දින වැටුප් ලෙස රු. 504,030 ක් ලබා ගෙන තිබුණි.

(ඊ) රජයේ ඉඩම්වල අයිතිය සුරක්ෂිත කිරීම සඳහා අනවසර අල්ලා ගැනීම් කටයුතු වලක්වා ගැනීම පිණිස සියළුම ග්‍රාම නිලධාරීන් විසින් තම වසම තුල පවතින අනවසරයෙන් අල්ලා ගැනීම් සම්බන්ධයෙන් ආ.ඒ.ආ.60 ආකෘති පත්‍ර මගින් සෑම දෙසතියකට වරක්ම ප්‍රාදේශීය ලේකම්වරයා දැනුවත් කලයුතු වුවත් මහියංගන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරීන් 20 ක් විසින් දෙසති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(උ) 2006 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය වෙත යොමු කරන ලද මැනුම් ඉල්ලීම් 1147 ක් ඉටු කරවා ගෙන නොතිබුණි.

(ඌ) මීගහකිවුල හා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ අනවසර අල්ලා ගැනීම් සම්බන්ධයෙන් සන්තකය ආපසු ලබාගැනීම සඳහා ලැබී තිබූ නෙරපීම් නියෝග 21 ක් ලැබී මාස 9 ත් වසර 5 ත් අතර කාලයක් ගතවී ඇතත් එම නියෝග ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රජයේ දේපල අයථා පරිහරණයකට ඉඩකඩ සැලසීමක් සිදුවී ඇති බව නියැදි පරීක්ෂාවකදී නිරීක්ෂණය විය.

(එ) බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 කට අයත් සමෘද්ධි බැංකු 47 ක් විසින් ප්‍රතිලාභීන් 2,636 කට ලබාදෙන ලද ණය මුදලින් රු.194,512,752 ක බොල්ණය 2023 දෙසැම්බර් 31 වන විටද අයකර ගෙන නොතිබුණි.

(ඒ) විවිධ වැය විෂයයන් යටතේ ගෙවීම් කිරීමේදී ගෙවීම්වල නිවැරදිතාවය ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 137,138 හා 200(4) ප්‍රකාරව තහවුරු කර නොගෙන ගෙවීම් කිරීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක් විසින් අවස්ථා 75 කදී වැඩිපුර සිදුකරන ලද රු.1,530,529 ක් වූ ගෙවීම් අදාල පරිදි වැය විෂයයන්ට අයිහාර කර තිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම්වල නිවැරදිතාවය තහවුරු කරගැනීමකින් තොරව ගෙවීම් සිදුකරන බවත් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මූල්‍ය පාලන කටයුතුවලට අදාල අභ්‍යන්තර පාලන පද්ධතීන් දුර්වල මට්ටමක පවතින බවත් නිරීක්ෂණය විය.

4. යහපාලනය

4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුව තුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 කට ලද දැව හෙලීම් බලපත්‍ර ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍ර 155 ක් මාස 1 ත් 22 ත් අතර ( දින 12 ත් 655 ත් අතර) කාල ප්‍රමාදයකින් පසුව (මසක කාලයක් ඉඩ දීමෙන් පසුව) ලියාපදිංචි කර නිකුත් කර ඇති බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව මහජනතාව සඳහා කාර්යක්ෂම හා කඩිනම් සේවාවක් ලබා දීමේ අවශ්‍යතාවය පුරවැසි ප්‍රඥාප්තිය තුල තහවුරු කර තිබියදී ඊට අනුකූලව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුව තුලදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 කට අදාලව තනි පුද්ගල ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා ලද අයදුම්පත් 73 ක් මාස 1 ත් 11 ත් අතර ( දින 26 ත් 315 ත් අතර ) කාල ප්‍රමාදයකින් පසුව (මසක කාලයක් ඉඩ දීමෙන් පසුව) ලියාපදිංචි කර නිකුත් කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) ජනාධිපති ලේකම්වරයාගේ 2020 සැප්තැම්බර් 15 දිනැති අංක PC/GPA/Circular/29/2020 දරන ජනාධිපති චක්‍රලේඛය අනුව සියළුම රජයේ ආයතනවල නිලධාරීන් මහජන දිනය වන සඳුදා දිනය තුල තම කාර්යාලයේ රැඳී සිටිය යුතු අතර අත්‍යවශ්‍ය කටයුත්තකට හැර එදිනට නිවාඩු ගැනීමෙන් හා කාර්යාලයෙන් පිටත රාජකාරි යොදා ගැනීමෙන් වැලකිය යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක මාණ්ඩලික නිලධාරීන්ගෙන් හා මාණ්ඩලික නොවන නිලධාරීන්ගෙන් සැලකිය යුතු පිරිසක් සඳුදා දිනය තුල කාර්යාලයේ සේවයට වාර්තා කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

2021 දෙසැම්බර් 24 දිනැති කලමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01-2019(i) හි 03 ඡේදය පරිදි සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දිනට පෙර ඉදිරි වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, ඊට අනුකූල වන ලෙස 2023 වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන සැලැස්ම විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය

2023 දෙසැම්බර් 31 දිනට බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 245 ක් පැවති අතර අතිරික්ත සංඛ්‍යාව 338 ක් විය .

| සේවා වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 81 | 56 | 25 | - |
| තෘතියික මට්ටම | 63 | 36 | 27 | - |
| ද්විතියික මට්ටම | 1858 | 2013 | 181 | 336 |
| ප්‍රාථමික මට්ටම | 149 | 139 | 12 | 02 |
| එකතුව | 2151 | 2244 | 245 | 338 |

කේ.එම්.ජයසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

කේ.එම්. ජයසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

පිටපත් -01. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

02. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

# 04 පරිච්ඡේදය

# කාර්යසාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

## 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| වැටුප් හා වේතන, වෙනත් දීමනා, රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොලී, | ✔ | | |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | | ✔ | |
| ගමන් වියදම් (දේශීය) | ✔ | | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | | ✔ | |
| ඉන්ධන | | ✔ | |
| ආහාරපාන හා නිල ඇඳුම් | ✔ | | |
| වාහන - නඩත්තු වියදම් | | | ✔ |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ - නඩත්තු වියදම් | ✔ | | |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් - නඩත්තු වියදම් | ✔ | | |
| ප්‍රවාහන | ✔ | | |
| තැපැල් හා සන්නිවේදන | ✔ | | |
| විදුලිය සහ ජලය | | | ✔ |
| බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | | | ✔ |
| වෙනත් | | ✔ | |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් - මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | ✔ | | |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ - මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | ✔ | | |
| වාහන - මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | | ✔ | |
| ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ - මූලධන වත්කම් අත්පත්කර ගැනීම් | ✔ | | |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ - මූලධන වත්කම් අත්පත්කර ගැනීම් | ✔ | | |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් - මූලධන වත්කම් අත්පත්කර ගැනීම් | | ✔ | |
| කාර්යමණ්ඩල පුහුණු - හැකියා වර්ධනය | ✔ | | |

# 05 පරිච්ඡේදය

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

# 5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම පෝෂණය වර්ධනය කිරීම හා තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම | දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන ක්‍රියාත්මක කිරීම | නව වාරි ව්‍යාපෘති 71 ක් ක්‍රියාත්මක කර අවසන් කිරීම | | ✔ | |
| | ජලාධාර හා ජල සම්පත් කළමණාකරන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | නව වාරි ව්‍යාපෘති 32 ක් ක්‍රියාත්මක කර අවසන් කිරීම | | ✔ | |
| සියළු දෙනාටම ජලය සහ සනීපාරක්ෂාව ලැබීමේ අයිතිය හා තිරසාර ජල හා සනීපාරක්ෂාව කළමනාකරණය සුරක්ෂිත කිරීම | ප්‍රජා ආශ්‍රිත ජල පෙරණ පද්ධති 54 ක්‍රියාත්මක කිරීම | ප්‍රජා ආශ්‍රිත ජල පෙරණ පද්ධති 54 ක්‍රියාත්මක කර අවසන් කිරීම | | | ✔ |
| සියලු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හි ම දුරු කිරීම. | ලෝක ආහාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම | ප්‍රතිලාභී පවුල් ඒකක 24,153ක් සඳහා ආහාර ද්‍රව්‍ය ලබා දීම | | | ✔ |
| | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩිදියුණු කිරීම | නිෂ්පාදන ගම්මාන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කර අවසන් කිරීම | | | ✔ |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

- තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉලක්ක කර දිස්ත්‍රික්කයේ ප්‍රමුඛතාවය අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් නොවීම.
- ආර්ථික අර්බුදය හමුවේ 2023.01.27 දිනැති අයවැය චක්‍රලේක අංක 01/2023 අනුව ප්‍රතිපාදන සීමා කිරීම.

# 06 පරිච්ඡේදය

## මානව සම්පත් පැතිකඩ

**6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය**

**6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය**

**6.3 මානව සම්පත් සංවර්ධනය**

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| සේවා මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/ (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 53 | 41 | 12 |
| තෘතීයික | 48 | 29 | 19 |
| ද්විතීයික | 1859 | 2015 | (156) |
| ප්‍රාථමික | 150 | 138 | 12 |

## 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

- ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 12 ක් පැවතීම නිසා පුරප්පාඩු පැවති කාර්යාලවල රාජකාරි ආවරණයට සහ වැඩබැලීමට නිලධාරීන් යෙදවීමට සිදුවීම හේතුවෙන් එම නිලධාරීන්ගේ වැඩ කොටස් වැඩි වූ අතර, ආයතනයේ නියමිත ඉලක්ක ළඟා කර ගැනීමට එම හේතුව ද යම්තාක් දුරට බාධාවක් විය.

- සෙසු මට්ටම් වල නිලධාරී හිඟයත් සම්පූර්ණ කරගැනීමට නොහැකි වීම මත, සේවයේ නියුක්ත නිලධාරීන්ගේ වැඩකොටස් වැඩි වූ අතර, ඒ හේතුවෙන් ඔවුන්ගෙන්ද උපරිම කාර්ය සාධනයක් නොලැබීම.

- කාන්තා නිලධාරීන් වැඩි ප්‍රමාණයක් සිටීම නිසා ප්‍රසූත නිවාඩු යන අවස්ථා වලදී මෙවන් මානව සම්පත් හිඟයක් පැවතීම රාජකාරී ආවරණයට වෙනත් නිලධාරීන් යෙදවීමටත්, ආයතනය නිසි ලෙස පවත්වාගෙන යාමටත් බාධකයක් විය.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය රු. (දේශීය) | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැවුම / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|
| පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව, වැටුප් පරිවර්තන හා විනය සම්බන්ධ පුහුණුව | 40 | දින 02 | 25,520.00 | දේශීය | විධිමත් පෞද්ගලික ලිපි ගොනුවක් නඩත්තු කිරීම හා යාවත්කාලීන කිරීම පිළිබඳ විෂය භාර නිලධාරීන් වෙත දැනුමක් ලබා දීම |
| පරිගණක පුහුණු පාඨමාලාව | 40 | දින 01 | 13,160.00 | දේශීය | නිලධාරීන් වෙත පරිගණක පිළිබඳ පුළුල් වශයෙන් දැනුමක් ලබා දීම |
| ආකල්ප සංවර්ධන වැඩසටහන | 60 | දින 01 | 24,650.00 | දේශීය | රාජකාරී කාර්යක්ෂමව ඉටු කිරීමට හැකිවන පරිදි කුසලතා හා ආකල්ප වර්ධනය |
| නිවාඩු විෂයට අදාල පුහුණුව | 40 | දින 01 | 16,860.00 | දේශීය | නිවාඩු ලබා ගැනීමේ දී නිලධාරීන් සැලකිලිමත් විය යුතු කරුණු සම්බන්ධයෙන් දැනුවත් කිරීම |
| නව කාර්යාල කාර්ය සහයක නිලධාරී පුහුණුව | 22 | දින 02 | 21,810.00 | දේශීය | කාර්යාල පසුබිම හා කාර්යාල ක්‍රම පිළිබඳ දැනුමක් ලබා දීම |
| ඉඩම් විෂයට අදාල කටයුතු පිළිබඳ පුහුණුව | 40 | දින 01 | 60,800.00 | දේශීය | ඉඩම් විෂය සම්බන්ධව දැනුම ලබා දීම |
| නිවාඩු, දුම්රිය බලපත්‍ර, දින වැටුප් හා විශ්‍රාම ගැන්වීම් පිළිබඳ පුහුණුව | 55 | දින 01 | 21,660.00 | දේශීය | සියළුම නිලධාරීන් වෙත විෂය සමබන්ධයෙන් දැනුමක් ලබා දීම |
| විනය හා විමර්ශන කටයුතු පිළිබඳ පුහුණුව | 36 | දින 01 | 56,750.00 | දේශීය | සියළුම මාණ්ඩලික නිලධාරීන් මඟින් නිලධාරීන් වෙත විනය පරීක්ෂණ සිදු කිරීම සම්බන්ධයෙන් දැනුමක් ලබා දීම |

**ආයතනයේ කාර්යය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්වල දායකත්වය**

| අනු අංකය | පුහුණු වැඩසටහන | ආයතනයේ කාර්යය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්වල දායකත්වය |
|---|---|---|
| 1 | පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව, වැටුප් පරිවර්තන හා විනය සම්බන්ධ පුහුණුව | පෞද්ගලික ලිපිගොනු නඩත්තුව වැටුප් පරිවර්තන හා විනය සම්බන්ධ පුහුණුව තුලින් සියළුම පෞද්ගලික ලිපි ගොනු විෂය භාර නිලධාරීන් වෙත පුළුල් දැනුමක් ලබා දීම හා නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව හා යාවත්කාලීන කිරීම |
| 2 | පරිගණක පුහුණු පාඨමාලාව | පරිගණක භාවිතයේ වැදගත්කම, කාර්යක්ෂමව රාජකාරී කටයුතු ඉටු කිරීම හා පරිගණක උපකරණ භාවිතය සම්බන්ධයෙන් මනා දැනුමක් ලබා දී රාජ්‍ය සේවයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම |
| 3 | ආකල්ප සංවර්ධන වැඩසටහන | නිලධාරීන්ගේ ආකල්ප සංවර්ධනය තුලින් සුහදශීලී මහජන සම්බන්ධතාවයක් ගොඩ නැංවීම |
| 4 | නිවාඩු විෂයට අදාල පුහුණුව | ආයතන සංග්‍රහයට අනුව නිවාඩු විෂයට අදාල ක්‍රමවේදයන් පිළිබඳ විෂය නිලධාරීන් මඟින් නිලධාරීන් තුල වඩා දැනුවත් භාවයක් ඇති කිරීම |
| 5 | නව කාර්යාල කාර්ය සහයක නිලධාරී පුහුණුව | නවක කාර්යාල කාර්ය සහයක නිලධාරීට රාජ්‍ය සේවය යනු කුමක්ද රාජ්‍ය නිලධාරීයා කවරෙක් ද යන්න මූලික දැනුම ලබා දීම තුලින් කාර්යක්ෂමව හා පහසුවෙන් රාජකාරී ඉටුකල හැකි වීම |
| 6 | ඉඩම් විෂයට අදාල කටයුතු පිළිබඳ පුහුණුව | ඉඩම් විෂයට අදාල රාජකාරී ඉටුකිරීමේ දී මෙන්ම දැව රාජකාරී කටයුතුවලදී එම රාජකාරී වඩාත් නිවැරදිව හා අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ඉටුකර රාජ්‍ය සේවාවන්හි ගුණාත්මක භාවය වැඩි වීමත් සමඟම හොඳ මහජන සම්බන්ධතාවයක් ගොඩ නැංවීම |
| 7 | නිවාඩු, දුම්රිය බලපත්‍ර, දින වැටුප් හා විශ්‍රාම ගැන්වීම් පිළිබඳ පුහුණුව | මේ සඳහා විෂය නිලධාරීන් පමණක් නොව සියළුම රාජ්‍ය නිලධාරීන් වෙත ලබාදුන් අතර, විශ්‍රාම ගැන්වීම පිළිබඳව නිලධාරී දැනුවත් කිරීම තුලින් තම පෞද්ගලික ලිපි ගොනු ගැටළුද විසඳා ගැනීමට හැකි පරිදි පුහුණු වැඩසටහන පැවැත්වීමෙන් රාජ්‍ය සේවයේ ගුණාත්මක බව ඉහළ නැංවීම |
| 8 | විනය හා විමර්ශන කටයුතු පිළිබඳ පුහුණුව | රාජ්‍ය නිලධාරීන් විසින් සිදු කරනු ලබන විනය විරෝධී ක්‍රියා ආයතන සංග්‍රහයේ II කොටස මඟින් සිදු කරනු ලබන විනය නියෝග ඇතුළු කටයුතු සම්බන්ධ පුළුල් අවබෝධයක් ලබා දීම තුලින් රාජ්‍ය සේවයේ කාර්යක්ෂම හා ගුණාත්මක බව ඉහළ නැංවීම |

# 07 පරිච්ඡේදය

# අනුකූලතා වාර්තාව

## 7.1 අනුකූලතා වාර්තාව

## 7.1 අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගතයුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ. | | |
| 1.2 | රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ. | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම ( වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ. | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ. | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ. | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ. | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනයට භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරිම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ. | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම. | අනුකූල වේ. | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳව ආයතනය තුල දැනුවත් කිරීම. | අනුකූල වේ. | | |
| 3.3 | ආයතනය තුල සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම. | අනුකූල වේ. | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ. | | |

| අනු අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල නොවේ. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් කලට වෙලාවට පිළිතුරු නොලැබීම. | නියමිත දිනට පිළිතුරු ලබාදෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීම |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ. | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4 ක් වත් අදාල වර්ෂය තුල පවත්වා ගෙන තිබීම. | අනුකූල වේ. | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 1/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 වන පරිච්ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධිකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ. | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල නොවේ. | 2023.06.21. දින විගණකාධිප තිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදු කොට තිබීම. | අනුකූල වේ. | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **9** | **වාහන කළමනාකරණ** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ. | | |
| 9.2 | වාහන ගර්භිත වී මාස 6 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අනුකූල නොවේ. | නඩු කටයුතු අවසන් වී නොතිබීම. | නඩු කටයුතු අවසන් වූ සැනින් අපහරණය කිරීමට කටයුතු කිරීම |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත් කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ. | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම. | අනුකූල වේ. | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම. | අදාල නොවේ . | කල්බදු පදනම මත ලබාගත් වාහන නොමැත. | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ. | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **12** | **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම. | අනුකූල වේ. | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ. | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල නොවේ. | ඌව පළාත් සභාව වෙතින් නිරවුල් කර නොතිබීම | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව  කටයුතු කර තිබිම. | අනුකූල වේ. | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ. | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම. | අනුකූල වේ. | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ. | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අනුකූල වේ. | | |
| 15.2 | රැස්කළ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ. | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |

| අනු අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම. | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩය පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ. | | |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ. | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ. | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනත 8 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ. | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ. | | |
| 18.2 | එම චක්‍ර ලේඛයේ 2.3 ජේදය පරිදි, පුරවැසි / සේවාලාභි ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ. | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම. | අනුකූල වේ. | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දි වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර තිබීම. | අනුකූල වේ. | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ. | | |